# නියමුවා

> "එය ධනපති ආණ්ඩුවක් නිසා පාන් දීම එයට කළ නොහැකිය. එයට දිය හැකි හොඳම දෙය, 'දක්ෂ ලෙස සංවිධානය කළ දුර්භික්ෂය' වන්නේය. නමුත් ජනතාව දුර්භික්ෂය පිළි නොගනු ඇත. පාන් තිබෙන බවත්, එය ලබා ගත හැකි බවත්, එහෙත්, එය ලබා ගත හැක්කේ ප්‍රාග්ධනයේ හා ඉඩම් හිමිකමෙහි ශුද්ධත්වයට ගරු නොකරන ක්‍රමවලින් පමණක් බවත්, ඔවුන් ඉගෙන ගනු ඇත. සමහර විට ඉතා ඉක්මනින් ඔවුන් එය ඉගෙන ගනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වැනි වෙළුම,**
**19 පිටුව**

ISSN 1391 - 1031 | 2021 අගෝස්තු 26 වෙළුම 06 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී




# බලය ලබා ගැනීමේ
# දේශපාලන වැඩපිළිවෙළකට
# ජාතික ජන බලවේගය සූදානම්

**රට ගොඩනැගීමේත් යහපත් රාජ්‍යයක් බවට පත්කිරීමේත් වගකීම භාරගැනීම සඳහා ජාතික ජන බලවේගය සූදානම් බවත් බලය හුවමාරු කර ගැනීමේ කණ්ඩායමක් දක්වා පරිවර්තනය වීමට සහ බලය අරමුණු කර ගත් දේශපාලන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සූදානම් බවත් අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, ඒ වෙනුවෙන් රටේ ජනතාවට ජාතික ජන බලවේගය වටා ඒකරාශී වන ලෙස ආරාධනා කළේය.**

අනුර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ අගෝස්තු 01වැනි දින පිටකෝට්ටේ සෝලිස් උත්සව ශාලාවේ පැවති ජාතික ජන බලවේගයේ විශේෂ මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"වර්තමාන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමත්, පාර්ලිමේන්තු මැතිවරණයේදී 2/3කට ආසන්න බලයක් ලබාදීමත් තුළ සැඟවී තිබුණේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා කෙරෙහි ජනතාව තුළ ගොඩනැගී තිබුණු විශ්වාසය සහ 2015 - 2019 ආණ්ඩුව ජනතාවගෙන් ප්‍රතික්ෂේප වීමත් කියන කරුණු දෙකයි. මේ කරුණු දෙකම වර්තමාන ආණ්ඩුවට ලැබුණු ඡන්ද ප්‍රතිඵලයේ ගැබ්වෙනවා. කෙසේ වුවත් බලය අරගෙන අවුරුදු 1 1/2කට වැඩි කාලයක් ගත වී තිබෙනවා. රට ගොඩනගාවිය යන බලාපොරොත්තුව සහිතව ඡන්දය දුන් බොහෝ පිරිසක් අද කළකිරීමට, රැවටීමකට භාජනය වීම නිසා ඔවුන්ගේ විරෝධයක් එල්ල වී තිබෙනවා. මෑත කාලයේ ඉතා කෙටි කාලයක් තුළ ජනතා අප්‍රසාදයට

## ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා

සහ විරෝධයට ගෝඨාභය රාජපක්ෂ පාලනය ලක්වී තිබෙනවා.

ඔහුගේ පුද්ගලික දුබලතාවයන් රැසක් තිබුණත් මෙය තනිකරම ඔහුගේ පුද්ගලික දුබලතාවයක් නෙමෙයි. දිගු කාලයක් තිස්සේ අනුගමනය කරන ලද ආර්ථික දේශපාලන ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක්. ජනාධිපතිවරයාගේ කාලය තුළ එය තීව්‍ර කෙරෙනවා පමණයි. මේ විදිහට තවදුරටත් අපේ රටට සහ ජනතාවට අනාගතයක් නැහැ. අපේ රටේ ගැඹුරුතම ආර්ථික අර්බුදය ණය කේන්ද්‍රකර ගත කරමින් නිර්මාණය වී තිබෙනවා. භාණ්ඩාගාරයට ලැබෙන ආදායම්, ණය වාරික සහ පොලී ගෙවීමටත් ප්‍රමාණවත් නැහැ. වර්ෂයක් තුළ උපයා ගන්නා ඩොලර් ණය පොලී වාරික ගෙවීමටත් ප්‍රමාණවත් නොවෙන තත්වයක් නිර්මාණය වී තිබෙනවා. මේ නිසා ආණ්ඩුව අධික ලෙස මුදල් මුද්‍රණය කරනවා. වර්තමාන ආණ්ඩුව පාලනය ගත් පසු රුපියල් ට්‍රිලියනයක මුදල් මුද්‍රණය කොට තිබෙනවා. මේ සතියේ එක් දිනකදී බිලියන 200 ඉක්මවූ මුදල් ප්‍රමාණයක් නිකුත් කළා.

අනික් පැත්තෙන් තවදුරටත් චීනය, ඉන්දියාව, බංගලිදේශයෙන් පවා ණය ඉල්ලමින් සිටිනවා. මේ අර්බුදය ඇති කරන ලද ණය පාරේම තවදුරටත් ගමන් කරමින් සිටිනවා. ඊට අමතරව ජාතික දේපළ විකිණීම ආණ්ඩුවේ තුන්වෙනි විසඳුම බවට පත්කරගෙන තිබෙනවා. කෙරවලපිටිය බලාගාරය, වරාය භූමියේ අක්කර 13කට ආසන්න ප්‍රමාණයක් චීන සමාගමකට ලබාදීම, සෙලෙන්දිවා ආයතනය ගොඩනගලා අපේ රටේ වාණිජ සහ පෞරාණික වටිනාකම්වලින් ඉහළම ගොඩනැගිලි සහ ඉඩම් විකිණීමට සූදානම් වෙනවා. ඔවුන් අර්බුදය විසඳීමේ මාවත බවට පත්කරගෙන තිබෙන්නේ ණය ගැනීම, දේපළ විකිණීම සහ මුදල් අච්චු ගැසීමයි. මේ මාර්ගය ඉතා කෙටි කාලයකින් නැවත අර්බුදය තීව්‍ර කරනවා. ජනතාව මුහුණ දෙමින් සිටින ආර්ථික ගැටලුවලට විසඳුම් නොමැති ගෝඨාභය රාජපක්ෂලා, පැරණි යල් පිනූ අසාර්ථක ගමන් මාර්ගයේම වේගයෙන් ගමන් කරමින් සිටිනවා.

එසේම නීතියේ හා විධානයේ ආධිපත්‍යය බිඳවැටීම, අධිකරණය කෙරෙහි තිබූ විශ්වාසය බිඳ වැටීම තුළින් සමාජ අර්බුද රැසක් නිර්මාණය වී තිබෙනවා. අපි මේ රටේ පුරවැසියන්ගෙන් අහන්නේ මේ ආකාරයට තවදුරටත් යා යුතුද කියන එකයි. අප විඳින මේ විනාශයේ ප්‍රතිඵල අපේ දරුවන්ට අත්පත් කර දිය යුතුද? ජාතික ජන බලවේගය විදිහට අපි මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා මෙය වෙනස් කිරීම සඳහා එකතු වන්න කියලා. ජාතික ජන බලවේගයේ අපි මේ රට ගොඩනැගීම සඳහා භාරගන්න සූදානම්. ඒ සඳහා දැක්මක්, වැඩපිළිවෙළක්, කැපකිරීමක්, ***02 වැනි පිටුවට***




# ප්‍රජාතන්ත්‍රවාදය රැකිය හැක්කේ සමාජ ක්‍රමය වෙනස් කිරීමෙන් පමණයි

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

මේ වන විට රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අරගලයක් තිබෙන නමුත් එය වියුක්ත අරගලයක් නොවන බවත් ප්‍රජාතන්ත්‍රවාදය අහිමිවීම මේ සමාජ දේශපාලන ආර්ථික අර්බුදයේම කොටසක් බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, වත්මන් ආර්ථික ක්‍රමයත් දේශපාලන ක්‍රමයත් පවුල් පාලනයත් මජර ප්‍රතිපත්තිත් පවත්වාගෙන යමින් සිටියෙදී ප්‍රජාතන්ත්‍රවාදය පමණක් වෙනම ආරක්ෂා නොවන බවත් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගත හැක්කේ සමස්ත ආර්ථික දේශපාලන සමාජ ක්‍රමය වෙනස් කිරීමෙන් පමණක් බවත් අවධාරණය කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 09වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවක් අමතමිනි. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා, මෙසේද පැවසීය.

"නිෂ්පාදනයේ ප්‍රතිලාභ කාටත් ලැබෙන ආර්ථිකය තුළ සාධාරණත්වය ගොඩ නැගිය යුතුයි. දේශපාලන පාදඩකරණය නැවැත්විය යුතුයි. දේශපාලනය ගරුකටයුතු එකක් බවට පත්කළ යුතුයි. දේශපාලකයින් ලබන අනවශ්‍ය ප්‍රතිලාභ නැවැත්විය යුතුයි. අධ්‍යාපනයේ වෙනසක් අවශ්‍යයි. සෞඛ්‍ය ප්‍රතිපත්තිවල වෙනසක් අවශ්‍යයි. සමස්ත සමාජ ක්‍රමයේ වෙනසක් අවශ්‍යයයි. ඒ වෙනස සමඟ ප්‍රජාතන්ත්‍රවාදී සටන බැඳිලා තිබෙනවා. මේ ධනපති පාලකයෝ යටපත් කරමින් තිබෙන්නේ ඔබේ දරුවාගේ අනාගතය වෙනුවෙන් කරන අරගලයේ හඬයි. එනිසා අහක බලාගෙන ඉන්න එපා. වඩා යහපත් ප්‍රජාතන්ත්‍රවාදය ජනතාවට ලබාදිය හැකි මානව හිමිකම් රකින්න පුළුවන් මිනිස්සුන්ගේ හඬට ඇහුම්කන් දෙන සමාජයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වෙන බලවේගයක් නිර්මාණය කරන්න, ඊට නායකත්වය දෙන්න අපි ලෑස්තියි. ඒ කටයුත්ත වෙනුවෙන් පෙළගැසෙන්න කියලා ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් අගය කරන ප්‍රගතිශීලි ජනතාවගෙන් ඉල්ලනවා."


**03 නිවැරදිව හඳුනාගත යුතු...**



නව ලිබරල්වාදී ආර්ථිකයත් ධනවාදයත් පවත්වාගෙන යන අය සමග පීඩිත බලවේගවලට, වමට, ප්‍රගතිශීලීන්ට සමගි විය හැකිද?...

**05 ආණ්ඩුවේ 2/3 ඉක්මවූ...**



කොතලාවල පනත කියන්නේ නිදහස් අධ්‍යාපනයේ අනාගතයට බරපතළ තර්ජනයක්. ඒ අනතුර ආරක්ෂා කරන්න විශ්වවිද්‍යාල පනත වෙනස් කරලා....

**07 අර්බුදයේ...**



ධනපති පාලනයේ මුග්ධ ස්වභාවය වන්නේ අර්බුදයෙන්ද වාසි ලැබිය හැකි නම් ඒ සඳහා ජනතාව මුලාකිරීමට උපක්‍රම යෙදීමය. "රාජපක්ෂ පවුල් සමාගම"...

**09 ළමා හිංසන බේදවාචකයේ...**



ළමා අපචාර, ළමා හිංසන, ළමා මෙහෙකාර සේවය සැබෑ ලෙසම පිළිකෙව් කරන, ඒවා ස්ථිර ලෙසම වැළැක්විය යුතුයයි සිතන සියලු දෙනාගේ වගකීම වන්නේ...

තරුණ.......... 04
ජාත්‍යන්තර.......... 06
කාන්තා.......... 08
විශේෂාංග.......... 10


***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

සටන් බිම

# කොතලාවල පනතට එරෙහිව ගුරු - සිසු විරෝධතා




ආණ්ඩුව විසින් ඉදිරිපත් කර ඇති කොතලාවල අධ්‍යාපන පනතට එරෙහිව අධ්‍යාපනයට සම්බන්ධ බලවේගයන්ගෙන් විරෝධතා පළ වෙමින් තිබේ. පසුගිය 05වැනි දින ලංකා ගුරුසේවා සංගමය හා සමාජවාදී ශිෂ්‍ය සංගමය ඒකාබද්ධව ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිටදී විරෝධතා උද්ඝෝෂණයක් පැවැත්වීය. අධ්‍යාපනයේ අයිතිය වනසන, මිලිටරිකරණයට පාර කපන කොතලාවල පනත වහා හකුළාගන්නා ලෙස බලකරමින් මෙම විරෝධතාවයේ අරමුණ විය. මෙහිදී අදහස් දැක්වූ ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පැවසුවේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත මගින් ආණ්ඩුව මුළුමහත් අධ්‍යාපනයම විනාශ මුඛයට ඇදගෙන යාමට කටයුතු කරන බවය. ආණ්ඩුව පසුගිය කාලයේ විවිධ ආයතනවලට හමුදා නිලධාරීන් යෙදවීමෙන් ඔවුන්ද අපහාසයට ලක් කළ බවද අධ්‍යාපනය හමුදාකරණය කිරීමෙන් අධ්‍යාපනයේ නිදහසද නැතිකරන බවද ඔහු පෙන්වා දුන්නේය. එමෙන්ම මෙම පනත මගින් විශ්වවිද්‍යාල සේම පාසල්ද පෞද්ගලීකරණය දිශාවට හරවා ඇති බවත් පසුගිය මෛත්‍රී, රනිල්, සජිත් ආණ්ඩුව විසින් ගෙන එන ලද සයිටම් සටන ජයග්‍රහණයෙන් අවසන් කළ බව මතක් කර දුන් ඔහු ඒ ලෙසම කොතලාවල පනතද පරාජය කළ යුතු බවද මෙහිදී අවධාරණය කළේය. එමෙන්ම ප්‍රගතිශීලී දේශපාලන ව්‍යාපාර, වෘත්තීය සංගම්, ශිෂ්‍ය ව්‍යාපාරය සමග ඒකාබද්ධව මෙම පනත මහ පාරේදී පරාජය කිරීමට කටයුතු කරන බවද මහින්ද ජයසිංහ සහෝදරයා මෙහිදී පැවසීය.

# විදුලි බලය විකිණීමේ ආණ්ඩුවේ මුට්ටි කුඩු කරන්න අපි සූදානම්

### ලංකා විදුලි සේවක සංගමය




විදුලි බල මණ්ඩලය විකිණීමේ පියවරක් ලෙස කෙරවලපිටිය ලක්දනවි විදුලි බලාගාරයේ 40%ක කොටස් ඇමරිකානු සමාගමකට ලබාදීමට ගෙන ඇති ආණ්ඩුවේ තීරණය, පෞද්ගලීකරණය වෙනුවෙන් මුට්ටිය දමා බැලීමක් බව කියා සිටි ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම් රංජන් ජයලාල් සහෝදරයා, ආණ්ඩුවේ මුට්ටි කුඩුවෙන්න පහර දෙන බවත් කෙරවලපිටිය වෘත්තීය අරගලවලින් යුද පිටියක් බවට පත්කරන බවත් ප්‍රකාශ කළේය.

ඔහුමේ බව පැවසුවේ පසුගිය 18වැනි පෙරවරුවේ කොළඹදී පැවති මාධ්‍ය හමුවක් අමතමිනි. එම මාධ්‍ය හමුව සඳහා ලංකා විදුලි සේවක සංගමයේ උප සභාපතිවරුන් වන අර්ජුන රණජීව, සුරේෂ් අත්තනායක, උප ලේකම් එම්. උගාස්, භාණ්ඩාගාරික එ.එම්. පත්මසිරි, සංවිධායක ලේකම් මනෝජ් ප්‍රියංකර යන සහෝදරවරුන්ද සහභාගි වී සිටියහ.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් රංජන් ජයලාල් සහෝදරයා මෙසේද පැවසීය.

"විදුලි බල මණ්ඩලය බැසිල්ලාගේ, මහින්දලාගේ, ගෝටලාගේ අප්පගේ බූදලේ" නෙමෙයි. විදුලි බල මණ්ඩලයේ සියලුම වෘත්තීය සමිති නායකයින් කොළඹට කැඳවා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කරනවා. ඇමරිකාවට විදුලි බල මණ්ඩලය විකිණීමේ ආණ්ඩුවේ කුට උත්සාහය පිළිබඳව ජනතාව දැනුවත් කරනවා. මේ රටේ කිසිදු ආයතනයකට නැති සම්බන්ධීකරණ ජාලයක් තියෙන්නේ අපිට විතරයි. ලක්ෂ 50ක් ඉක්මවා ගිය විදුලි පාරිභෝගිකයෝ ඉන්නවා. අපේ සාමාජිකයෙක් මාසෙකට සැරයක් විදුලි බිල දෙන්න ගෙදරකට ගොඩ වෙනවා.

අපි දැනටමත් තීන්දු කරලා ඉවරයි පාරිභෝගික කමිටු ගම් මට්ටමින් දාන්න. බොහෝවිට ඉස්සරහට තත්වය තවත් දරුණු වෙයි. මේක පිටිපස්සේ ඉන්නේ අපි කියලා කියන්න එපා. අපි අද ඉඳන් මේක අතට ගන්නවා. අපි ගම සංවිධානය කරනවා, ආණ්ඩුවේ මේ වැඩපිළිවෙලට විරුද්ධව. ඒ වෙනුවෙන් ඕනෑම දෙයක්ම කැපකරන්න අපි සූදානම්."

# නිරෝධායනය දඬුවමක් ලෙස යොදාගැනීමට විරුද්ධයි

### සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමය




පසුගිය කාලය පුරාම පොලීසිය විසින් දඬුවම් ලෙස විවිධ පුද්ගලයන් නීති විරෝධී සහ බලහත්කාරී නිරෝධායන ක්‍රියාවලියකට යොමු කරනු ලැබීම ගැටලු සහගත බව සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පවසයි. පසුගිය දිනයකදී ද උද්ඝෝෂකයින් පිරිසක් ඒ ආකාරයට නීති විරෝධී ලෙස නිරෝධායනය සඳහා යොමු කිරීම පිළිබඳව තම සංගමයේ විරෝධය පළ කරන සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මින් ඉදිරියට නිරෝධායනය දඬුවමක් ලෙස ක්‍රියාත්මක කිරීමේ නීති විරෝධී ක්‍රමවේදය නතර කර දමන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටී. සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර විසින් පොලිස්පතිවරයා වෙත ලිපියක් යවමින් මේ බව කියා සිටී.

එම ලිපියේ වැඩිදුරටත් මෙසේ සඳහන්ය. "කොවිඩ් වසංගතය පාලනයට අදාලව නිරෝධායනය යනු සෞඛ්‍යය නිර්දේශ මත සිදුකළ යුතු වසංගත මර්දන ක්‍රියාවලියකි. නිරෝධායනය පිළිබඳව බලතල පැවරී ඇත්තේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාටය. පුද්ගලයන් නිරෝධායනය සම්බන්ධව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් 2020.11.16 දිනැති හා EPID\400\2019\n-CoV\Guidelines අංක දරන චක්‍රලේඛයේ පැහැදිලිව උපදෙස් ලබා දී ඇති අතර ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිරෝධායනය පිළිබඳව මාර්ගෝපදේශ අනුවද ඉහත චක්‍රලේඛය අනුවද කිසියම් පුද්ගලයෙකු නිරෝධායනට ලක් කල හැකි අවස්ථා දෙකක් ඇත. 01.කොවිඩ් ආසාධිතයෙකු ගේ ආශ්‍රිතයෙකු වීම. 02. කොවිඩ් වසංගතය සමාජය ව්‍යාප්තිය දක්වා පැතිරුණු රටකින්/ ප්‍රදේශයකින් රට තුළට/ එසේ නොවන ප්‍රදේශයකට ඇතුළු වීම.

ඉහත කාරණා වලට අදාල පුද්ගලයන් නිරෝධායන කිරීමේ බලතල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහජන සෞඛ්‍ය අංශ වෙත පවරා ඇත. නමුත් පසුගිය කාලය පුරාම පොලීසිය විසින් දඬුවම් ලෙස විවිධ පුද්ගලයන් නීති විරෝධී සහ බලහත්කාරී නිරෝධායන ක්‍රියාවලියකට යොමු කරනු ලැබීම ගැටලු සහගතය. පසුගිය දිනයකදී ද උද්ඝෝෂකයින් පිරිසක් ඒ ආකාරයට නීති විරෝධී ලෙස නිරෝධායනය සඳහා යොමු කිරීම පිළිබඳව අප සංගමයේ විරෝධය පළ කරන අතර ඔවුන් වහාම නිදහස් කරන ලෙසත් මින් ඉදිරියට නිරෝධායනය දඬුවමක් ලෙස ක්‍රියාත්මක කිරීමේ නීති විරෝධී ක්‍රමවේදය නතර කර දමන ලෙසත් ඉල්ලා සිටිමු."

# හොටල් සේවක ගැටලු විසඳනු! හෝටල් සේවක උද්ඝෝෂණ ඇරඹේ



කොරෝනා වසංගතයත් සමග දැඩි පීඩාවකට පත් හෝටල් සේවකයින්ගේ ගැටලු විසඳන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටියද මෙතෙක් විසඳුම් ලබා නොදීම හේතුවෙන් රට පුරා උද්ඝෝෂණ මාලාවක් පැවැත්වීමට හෝටල් සේවක මධ්‍යස්ථානය කටයුතු කොට ඇත. ඒ අනුව පසුගිය 19වැනි දින අලුත්ගම නගරයේදී පළමු උද්ඝෝෂණය පැවැත්වුණු අතර ඒ සඳහා හෝටල් සේවක මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක ජයතිලක රණසිංහ සහෝදරයා ඇතුළු හෝටල් සේවකයෝ විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

මෙහිදී පසුගිය පාස්කු ප්‍රහාරයේ සිට හෝටල් සේවාව මුහුණ දී ඇති දැවැන්ත අර්බුදය හමුවේ මේ වන විට හෝටල් සේවකයින් කුලී වැඩ කරමින් ජීවිකාව කරගෙන යාමට උත්සාහ කරන බවද, වසර 2 ක් ඉක්ම වී ගිය නමුත් ආණ්ඩුවට තවමත් මේ පිළිබඳව කිසිදු අවධානයක් යොමු කර නොමැති බවද ජයතිලක සහෝදරයා පැවසුවේය. එබැවින් සියලු සේවකයින් සඳහා රු. 15,000ක මාසික දීමනාවක් ලබාදීමටත්, කප්පාදුවකින් තොරව සේවක වැටුප් ලබාදීමටත්, සේවා ගාස්තුවෙන් කොටසක් සේවක වැටුපට එකතු කිරීමටත් ආණ්ඩුව කටයුතු කළ යුතු බවද මෙහිදී ජයතිලක රණසිංහ සහෝදරයා අවධාරණය කළේය.

මේ අතර පසුගිය 26වැනිදා කොටුව සංචාරක අමාත්‍යාංශය ඉදිරිපිටදීද හෝටල් සේවක මධ්‍යස්ථානය විසින් සහන ඉල්ලා විරෝධතාවක් සංවිධානය කර තිබිණි.

## එතෙරින්...

# ලන්ඩනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂණයක්!




ශ්‍රී ලංකාවේ සිදුවන අධ්‍යාපනය මිලිටරිකරණය කිරීම ඇතුළු ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා වහා නතර කරන ලෙස ලංකාවේ ආණ්ඩුවට බලකරන උද්ඝෝෂණ ව්‍යාපාරයක් පසුගියදා බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඉදිරිපිට පැවැත්විණි. එක්සත් රාජධානියේ ජාතික ජන බලවේගය ශාඛාව විසින් සංවිධානය කර තිබූ මෙම උද්ඝෝෂණයට සතියේ දිනයක් වුවද එදින බැහැර ප්‍රදේශවලින් පවා විශාල පිරිසක් එක්වී සිටි අතර සිංහල දෙමළ හා මුස්ලිම් සහෝදරත්වයෙන් එක්වී සිටියහ.

රජය, ජාතික සම්පත් විකිණීමට විරුද්ධත් අධ්‍යාපනය මිලිටරීකරණය දක්වා ගෙන යන කොතලාවල පනතට විරුද්ධවත්, ළමා අපයෝජකයන්ට වහා දඬුවම් ලබාදීම, පවුල් පාලනය අවසන් කිරීම වැනි ප්‍රධාන සටන් පාඨ කිහිපයක්ම මෙහිදී දකින්නට ලැබිණි.

උද්ඝෝෂණය අවසානයේදී තානාපති කාර්යාලයට ලිපියක් බාරදීමද සිදුවිය.

---

# කියුබාවට අත නොතබනු! රෝමයේ උද්ඝෝෂණයට ජ.වි.පෙ. සහය




ඇමරිකා එක්සත් ජනපද අධිරාජවාදීන් විසින් කියුබාවේ ස්වෛරීභාවයට එරෙහිව කරනු ලබන අතපෙවීම් නැවතීමට, අයුක්තිසහගත ආර්ථික සම්බාධක ඉවත්කිරීමට බලකරන උද්ඝෝෂණයන් මේ වන විට ලොව පුරා ප්‍රගතිශීලී ව්‍යාපාරයන් විසින් සංවිධානය කරනු ලබමින් තිබේ.

ඊට සමගාමීව ඉතාලියේද නගර ගණනාවකදී කියුබාවට සහය පළ කරමින් උද්ඝෝෂණ ව්‍යාපාරයන් ක්‍රියාත්මක වෙමින් තිබේ.

කියුබානු ජනතාවට ඓතිහාසික වශයෙන් වැදගත් දිනයක් වන මොන්කාඩා ප්‍රහාරය දියත් කළ ජූලි 26 දින රෝමයේ කියුබානු තානාපති කාර්යාලය අසළදී රෝමයේ ප්‍රගතිශීලී ව්‍යාපාරයන් විසින් සංවිධානය කළ කියුබානු රජයට, කියුබානු ජනතාවට සහය පළ කරන උද්ඝෝෂණයක් සතියේ වැඩකරන දිනයක් වුවද විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. උද්ඝෝෂණය අවසානයේ ඉතාලියේ කියුබානු තානාපති සහෝදරයාද උද්ඝෝෂණයට එක්වෙමින් ඉතාමත් උද්වේගකාරී කතාවක් කළේය.

මෙම අවස්ථාවට එක්වූ ජනතා විමුක්ති පෙරමුණ-ඉතාලි කමිටුවේ නියෝජනය සහ කියුබාවට ජාත්‍යන්තරවාදී සහයෝගිතාවය ප්‍රකාශ කිරීමද විශේෂ ඇගයීමට ලක් විය.

---

# රෝමයේ අන්තර් සංස්කෘතික උළෙලට ජ.වි.පෙ.ත්



ලෝකයේ විවිධ රටවල ආහාර මෙන්ම සංස්කෘතික අංග ලක්ෂණසහිතව පසුගිය ජූලි 15 සිට ජූලි 28 දක්වා රෝමයේ Csaa exsnia සමාජ මධ්‍යස්ථානයේදී පැවති අන්තර් සංස්කෘතික උත්සවය සඳහා ජ.වි.පෙ. රෝමයේ සංවිධානයද එක්විය.ඩ

මෙම අවස්ථාවට විශාල පිරිසක් සහභාගි වී සිටි අතර, එය ආහාර වැඩසටහන ඉක්මවූ එක් එක් රටවල සංස්කෘතික හා අන්‍යෝන්‍ය අවබෝධතාවය, ප්‍රකාශන, හුවමාරු කර ගත් අවස්ථාවක් බවට පත්විය.

---

1 පිටුවෙන්.. ඉතිරි...

# බලය ලබා ගැනීමේ...

අප සතුව තිබෙනවා. අගාධයට යමින් තිබෙන රට ගොඩනැගීමට අපට හැකියාව තිබෙන බවට දැඩි විශ්වාසයක් තිබෙනවා. අපට එය ගොඩනැගිය හැකියි.

මේ සඳහා බලය අත්පත් කර ගත යුතුයි. මේ රටේ පුරවැසියන් දශක ගණනාවක් විවිධ පාලනයන් ගොඩනගා තිබෙනවා. එහි අවසන් ප්‍රතිඵලය ජනතාව අපේක්ෂා භංගත්වයට පත්වීම, ජනතාවට දුන් පොරොන්දු මුළුමනින්ම සුනුවිසුනු කොට දැමීමක්. ජනතාවට දේශපාලනය එපා වන තරමට අපේක්ෂාභංගත්වයට පත්කරනු ලැබ තිබෙනවා. අපි ඉල්ලා සිටින්නේ "ඔබ මේ රට වෙනස් කිරීම සඳහා ජාතික ජන බලවේගය වටා ඒකරාශී වෙන්න" කියලා. අපේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාර සහ සංවිධාන සමග සාකච්ඡා කරමින් මේ රට ගොඩනැගීමේ ප්‍රධානතම මහජන ව්‍යාපාරය බවට ජාතික ජන බලවේගය පත්කරමින් තිබෙනවා. කොවිඩ් තත්වය සැලකිල්ලට ගනිමින් රටේ සෑම නගරයකටම ගොස් වෘත්තීයවේදීන්, ව්‍යාපාරිකයන් ඇතුළු පුරවැසියන් එක්ක පවතින ගැටලු සාකච්ඡා කරන්න සැලසුම් කොට තිබෙනවා. සාහිත්‍යධරයන්, නීතිඥයන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන් රාජ්‍ය සේවකයන් ඇතුළු සියලු දෙනා මුණගැසී මේ රට වෙනස් කර ගැනීම වෙනුවෙන් බලවේගයක් හැටියට ගොඩනැගීමේ කටයුතු කරමින් තිබෙනවා."

මේ මාධ්‍ය හමුවේදී එක්සත් වාමාංශික බලවේගයේ ලේකම් අධිනීතිඥ ලාල් විජේනායක, පාර්ලිමේන්තු මන්ත්‍රීනී ආචාර්ය හරිනී අමරසූරිය, මහාචාර්ය හිනිදුම සුනිල් සෙනවි, මහාචාර්ය ලියනගේ අමරකීර්ති යන මහත්ම මහත්මීහුද අදහස් දැක්වීමට එක්ව සිටියහ.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# සියල්ල විකුණන ක්‍රමයක් තුළ අධ්‍යාපනයේ අනාගතය?

නිදහස් හා නොමිලේ අධ්‍යාපනය ක්‍රමානුකූලව අහෝසි කරන, උසස් අධ්‍යාපනය මිලිටරීකරණයට පාර කපන කොතලාවල පනත මෙම අගෝස්තු 6වැනිදා පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැනීමට නියමිතය. මෙම පනතට එරෙහිව දැනටමත් ගුරුවරුන්, සිසුන්, දෙමාපියන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු විශාල පිරිසකගේ විරෝධය එල්ල වී තිබේ. සටන වීදි පුරා දිගහැරෙමින් තිබේ. එහෙත් මෙම පනතට එරෙහිව වීදි බැස ඇති බොහෝ දෙනාගේද ඡන්දයෙන් පත්වූ වර්තමාන ආණ්ඩුව එකී ඊනියා ජනවරම යොදා ගනිමින්ම පාර්ලිමේන්තුව තුළ මෙම පනත සම්මත කර ගැනීමට බොහෝවිට ඉඩ ඇත.

පසුගිය වසර 40ක පමණ තිස්සේ ක්‍රමානුකූලව නිදහස් අධ්‍යාපනය අහෝසි කරන දිශානතියක් වෙත රට ගමන් කරමින් සිටී. ඒ නිසාම මෙම අර්බුදය දේශපාලනිකව වටහා ගැනීම නිදහස් අධ්‍යාපනය රැක ගැනීමට කැමති, ඒ සඳහා සටන් කරන අයගේ පැත්තෙන් අත්‍යාවශ්‍ය වේ.

අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීම, ඇමතිවරයාගේ කැමැත්ත හෝ එක් එක් ආණ්ඩුවක හිතුවක්කාර තීරණයක ප්‍රශ්නයක් නොවේ. මෙය ධනවාදයේ අරමුණු හා ප්‍රතිපත්ති සමග බැඳී ඇති ප්‍රශ්නයකි. මෙම ව්‍යසනය සැබෑ ලෙසම පැරදවිය හැක්කේ එය එලෙස වටහා ගතහොත් පමණි.

ධනේශ්වර ක්‍රමය ලොව කොතන කුමන ආකාරයෙන් ක්‍රියාත්මක වුවද එහි පදනම වන්නේ ප්‍රාග්ධනය මගින් ලාභ ලැබීමය. ධනවාදය ලාභ ඉපැයීම මත පදනම් වූ ක්‍රමයකි. එහිදී ධනවාදය තුළ ලාභ ලැබීමට නම් සියල්ල විකිණිය යුතුය. ඒ අර්ථයෙන් ගන්නා විට ධනවාදය තුළ සියලුම දේ (මිනිසුන්, ගැහැනුන්, දරුවන් පවා) වෙළඳ භාණ්ඩ බවට පත්වේ. අධ්‍යාපනය විකිණීමට දරන උත්සාහය දෙස බැලිය යුත්තේ මෙම සත්‍යය මත පිහිටමිනි.

පසුගිය දශක කිහිපයක් පුරා ඇතැම් ධනපති රටවල අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි අත්‍යවශ්‍ය මහජන සේවා නොමිලයේ පවත්වාගෙන යන ලදී. එය එසේ වූයේ එක් අතකින් එම රටවල වමේ ව්‍යාපාරයන් විසින් කරන ලද දැවැන්ත අරගලයන්ගේ බලපෑම නිසාය. අනෙක් අතට ධනවාදයේ සංවර්ධනයේ එක් අවස්ථාවක එම රටවල ධනපති පංතියට රාජ්‍ය ඒකාධිකාර ධනවාදය (ජනසතු) හා රාජ්‍ය සුබසාධනවාදය පවත්වාගෙන යාමට තත්වයන් විසින් බල කරන ලද නිසාය.

1917 ඇරඹි ඔක්තෝබර විප්ලවයෙන් පසු 1990 දක්වා කාලය තුළ ප්‍රබල සමාජවාදී රාජ්‍ය පද්ධතියක් පැවතීමත්, එහි බලපෑම හා ඒ හමුවේ ධනවාදය රැකගැනීමේ අභියෝගයත් බොහෝ ධනපති රටවලට තාවකාලිකව හෝ රාජ්‍ය සුබසාධන ක්‍රමයක් පවත්වාගෙන යාමට බල කරන ලදී. එසේ නැතිව එය ධනපති ක්‍රමයේ සැබෑ කැමැත්ත වූයේ නැත.

1975 වන විට රාජ්‍ය සුබසාධනවාදය තවදුරටත් පවත්වාගෙන යා නොහැකි ලෙස ධනවාදය අර්බුදයට ගිය අතර ඊට විසඳුම් ලෙස ඉදිරිපත් වූයේ ඊනියා ගෝලීයකරණය තුළ වෙළඳපොළ ආර්ථිකය පුළුල් කිරීමේ, ආර්ථිකය විවෘත කිරීමේ විසඳුමය. මෙය නව ලිබරල්වාදය ලෙස දේශපාලන වශයෙන් හඳුනා ගැනේ. දැන් අප වැනි රටවල එතෙක් පැවති නිදහස් සෞඛ්‍ය සේවය හා නිදහස් අධ්‍යාපනය පියවරෙන් පියවර හැම පාලනයක් විසින්ම පෞද්ගලීකරණයේ දිශාවට ගෙන යන්නේ මේ තත්වය තුළය.

නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය අහෝසි කර, මේ සියලු සේවාවන් වෙළඳපොළ සමග ගැටගැසීමට ධනපති ක්‍රමයට අවශ්‍ය වුවත් මෙම සේවාවන්ගෙන් සහනය ලබන ජනයා ඊට කැමති නැත. වමේ ව්‍යාපාරය එහි පෙරමුණේ සිටී. ඒ නිසා මෙකී සේවාවන් පෞද්ගලීකරණය කිරීමට ධනපති ආණ්ඩුවලට සිදුවී තිබෙන්නේ විරෝධයන් මැදය. ඒ නිසා මෙම සේවා පෞද්ගලීකරණයේ දිශාවට ගමන් කරන්නේ පියවරෙන් පියවර ක්‍රමානුකූලවය. එහෙත් අවසානයේ ධනවාදය තුළ මෙය නතර වන්නේ අධ්‍යාපනය, සෞඛ්‍යය මුළුමනින්ම පෞද්ගලීකරණය වී වෙළඳපොළ භාණ්ඩ බවට පත්වීමෙන් බව නම් පැහැදිලිය.

මෙම සත්‍යය අපට උගන්වන පාඩමක් තිබේ. ඒ නිදහස් අධ්‍යාපනය ඇතුළු මහජන සේවා රැකගැනීමට අප කොතෙක් උත්සාහ කළත් කොතෙක් සටන් කළත් ධනවාදය පවතින තාක් ඒවා ටිකෙන් ටික අපට අහිමි වන බවය. එබැවින් මෙකී සේවා රැකගැනීමේ ස්ථිරසාර විසඳුම ධනවාදය පැරදවීමේ අරගලය සමග බැඳී තිබේ.

මෙම අර්බුදය විසින් අපට උගන්වන තව පාඩමක් ඇත. ඒ, මෙරට ජනයාගේ ඡන්දදායක කාර්යභාරය පිළිබඳවය. අපේ රට සාතිශය බහුතරයක් ජනයා නිදහස් අධ්‍යාපනය අහෝසි කරනවාට අකමැතිය. නිදහස් සෞඛ්‍යය අහිමි වනවාට අකමැතිය. රටේ සම්පත් ඉඩම් විකුණනවාට අකැමතිය. ඒවා රැක ගැනීම වෙනුවෙන් සටන් කිරීමට පවා සූදානම්ය. එහෙත් මහජන සේවා පෞද්ගලීකරණයට එරෙහි, රටේ සම්පත් විකිණීමට එරෙහි ජනයාම මැතිවරණයකදී එකී ප්‍රතිපත්ති ක්‍රියාවට නඟන පක්ෂවලට ඡන්දය දී ඔවුහු සිංහාසනාරූඪ කරවති. ඉන්පසු තමන් බලයට පත් කළ ආණ්ඩුව සමගම අයිතීන් වෙනුවෙන් සටන් වදිති. මෙය තාර්කිකව ගත්කළ කිසිදු තේරුමක් නැති වැඩකි. දේශපාලන වශයෙන් අපරාධයකි.

ඒ නිසා මහජන සේවාවන් හා රටේ සම්පත් රැකගැනීමට අවංකවම කැමති ජනයා, එම සම්පත් රැකගැනීම සඳහා සටන් කරන ධෛර්යයෙන්ම, නිදහස් අධ්‍යාපනය රැක ගැනීමට සටන් කරන ධෛර්යයෙන්ම, කොතලාවල පනත පැරදවීමට සටන් කරන ධෛර්යයෙන්ම ධනවාදය පැරදවීමටත්, ධනපති පක්ෂ බලයට ගෙනවීම නොකර සිටීමටත් අදිටන් කරගත යුතුව තිබේ. මෙම ව්‍යසනයෙන් මිදීමට ඒ මඟහැර අන් මඟක් අප ඉදිරියේ නැත.

# නිවැරදිව හඳුනාගත යුතු සැබෑ අභියෝගය



ශ්‍රී ලංකාව මේ වන විට පවතින්නේ ආර්ථික, සමාජයීය, දේශපාලන හා සංස්කෘතික වශයෙන් අගාධයක් අද්දරය. ප්‍රචණ්ඩ මහා සුළි කුණාටුවක් මෙන් ආර්ථික විනාශය අප හමුවේ වර්ධනය වෙමින් තිබේ. සියලුම ජනයා ආර්ථික විනාශය විසින් නිර්මාණය කරන ලද, ආදායම් අහිමිවීම හා ඉහළ යන බඩුමිල නිසාද, මහජන සේවා බිඳවැටීම හා පරිපාලන අරාජිකත්වය නිසාද, කොරෝනා උවදුර නිසාද, සමාජ දේහයේ පිරිහීම නිසාද පීඩාවට පත්ව සිටිති. දෙමාපියෝ, ගුරුවරු, සිසුහු නිදහස් අධ්‍යාපනය රැකගැනීමට මහපාරට බැස සිටිති! තම වැටුප් විෂමතා ඉවත්කර ගැනීමේ සාධාරණ සටන වෙනුවෙන් වීදි බැසීමට ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට සිදුව තිබේ. (මේ අයගෙන් බහුතරය ඡන්දය දුන්නේ මෙම පාලනයටය) පොහොර වෙනුවෙන් මහමඟට බැසීමට ගොවියාට සිදුව තිබේ. හැම තැනම අර්බුදය; හැම තැනම සටන්ය; ඉන් පෙන්නුම් කරන්නේ අපේ සමාජය බරපතළ අර්බුදයක ඇති බවය.

මේ මොහොතේ අප ඉදිරිපිට ඇති මෙම විනාශකාරී අර්බුදයෙන් මෙරට පීඩිත ජනයා මිදිය යුතුය. ඒ සඳහා තමන් යා යුතු මඟ පිළිබඳව ඔවුනට වැටහීමක් තිබිය යුතුය. ඒ සඳහා අර්බුදය පිළිබඳව හා අප ඉදිරියේ ඇති අභියෝගය පිළිබඳව නිවැරදි වැටහීමක්ද තිබිය යුතුය.

ඉතා හොඳින් බැලූ කළ පැහැදිලි වන කරුණ වන්නේ මෙලෙස සමාජය තුළ විවිධාකාරයෙන් ප්‍රකාශයට පත්ව ඇත්තේ ධනපති ක්‍රමයේත්, ආර්ථිකයේත් අර්බුදයම බවය. මතුව ඇති පීඩාවට, අර්බුදයට නිවැරදි විසඳුම් සොයනවා වෙනුවට තමන්ට බලය ගැනීම සඳහා මෙම අර්බුදය යොදා ගැනීමට උත්සාහ කරන සමහර පුද්ගලයන් පක්ෂ හා කණ්ඩායම් අර්බුදයේ සැබෑ හේතුව යටපත් කර තමන්ට පහසු සටන් පාඨ යළි මතුරන්නට පටන්ගෙන තිබේ.

වත්මන් රාජපක්ෂ පාලනය බලයට ඒම සඳහා පරිසරය නිර්මාණය කර දුන්, රනිල්-මෛත්‍රී අසාර්ථක ආණ්ඩුවේ ප්‍රබලයන් වූ සජිත් ප්‍රේමදාසලා, කරු ජයසූරියලා වත්මන් අර්බුදය නැමති බොරදියේ යළිත් මාළු බෑමට උත්සාහ කරමින් සිටින බව පෙනේ. ඒ සඳහා යළිත් විවිධ චිත්තාකර්ෂණීය පොරොන්දු හා සටන් පාඨ නිර්මාණය කරනු පෙනේ. එහෙත් ඉතිහාසය මෙරට ජනයාට උගන්වා ඇති පාඩම ඉතාම පැහැදිලිය. ඒ 2019 බලයට ආ ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ පාලනය අසාර්ථක වනවා මෙන්ම ඊට පෙර තිබූ 2015 යහපාලන දේශපාලන ව්‍යාපෘතියද මුළුමනින්ම අසාර්ථක වූ බවය. එයට යළි පණ දීමට නොහැක. ගෝඨාභය රාජපක්ෂලාට මේ තරම් බලයක් නිර්මාණය කර දුන්නේද එම ඊනියා යහපාලන ආණ්ඩුවේ අරාජිකත්වය හා අසමත්කම විසිනි. සත්‍යය වන්නේ එයයි.

අනෙක් අතට සමහර කණ්ඩායම් තුළින් දැන් පුළුල්, පොදු මහජන ව්‍යාපාර ගොඩනැගීමට, සියලු දෙනා සමගි කිරීමට කරන කථාවන්ද ඇසෙන්නට පටන් ගෙන තිබේ. ලෙනින් වරක් කියූ ලෙස සමගිය ඉතාම හොඳ දෙයකි. එහෙත් සමගිය ගැන කථා කිරීමට පෙර සමගිය කුමක් සඳහාද? කා සමගද? යන්න තෝරා බේරා ගත යුතුව තිබේ. නව ලිබරල්වාදී ආර්ථිකයත් ධනවාදයත් පවත්වාගෙන යන අය සමග පීඩිත බලවේගවලට, වමට, ප්‍රගතිශීලීන්ට සමගි විය හැකිද? සත්තකින්ම නොහැක. එසේම අප සමගි විය යුත්තේ මැරී කුණුවී දුගඳ හමන මළකුණක් බවට පත්ව ඇති වත්මන් ධනපති ක්‍රමයටම සළුපිළි අන්දවා තවත් ටික දිනක් තබා ගැනීම සඳහාද? නැත. එබැවින් පරාජයට පත්ව සිටින, යළි බලයට ආශාවෙන් සිටින කපටි ආරක්ෂකයින්ගෙන් ජනතාව පරෙස්සම් විය යුතුව තිබේ.

මහා විනාශයක් වෙත ගමන් කරන වත්මන් අර්බුදය තම ධනේශ්වර දේශපාලන ව්‍යාපෘති සමග සම්බන්ධ කර ගැනීමට උත්සාහ කරන ප්‍රතිගාමී කණ්ඩායම් මෙහිදී මතුකරන දෙයක් තිබේ. ඒ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකීමට එකතු විය යුතු බවය. ඒ සඳහා ඔවුන් විසින් "පරිවර්තනීය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක්" නැමති

> නව ලිබරල්වාදී ආර්ථිකයත් ධනවාදයත් පවත්වාගෙන යන අය සමග පීඩිත බලවේගවලට, වමට, ප්‍රගතිශීලීන්ට සමගි විය හැකිද? සත්තකින්ම නොහැක. එසේම අප සමගි විය යුත්තේ මැරී කුණුවී දුගඳ හමන මළකුණක් බවට පත්ව ඇති වත්මන් ධනපති ක්‍රමයටම සළුපිළි අන්දවා තවත් ටික දිනක් තබා ගැනීම සඳහාද? නැත. එබැවින් පරාජයට පත්ව සිටින, යළි බලයට ආශාවෙන් සිටින කපටි ආරක්ෂකයින්ගෙන් ජනතාව පරෙස්සම් විය යුතුව තිබේ.

ලස්සන සටන් පාඨයක් නිර්මාණය කරනු ලැබ තිබේ.

අපේ රටේ ආණ්ඩු විරෝධීන් බිය වැද්දීමටත්, මර්දනය දියත් කර තිබෙන බව ඇත්තය. නීතියට ඇඟිලි ගැසීම්, ව්‍යවස්ථා නොසලකා වැඩ කිරීම් තිබෙන බව ඇත්තය. ඒ නිසාම ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටලුවක් තිබේ. එහෙත් එය තිබෙන්නේ ආර්ථික විනාශයට ඉහළින් නොව ඊට පහළිනි. අපේ රටේ මේ මොහොතේ ඇති ප්‍රධාන හා කේන්ද්‍රීය ප්‍රශ්නය නව ලිබරල් උපායමාර්ගය විසින් ජනිත කර ඇති විනාශකාරී ආර්ථික අර්බුදයය. එය දෙවැනි කොට 'ප්‍රජාතන්ත්‍රවාදය' පිළිබඳ සටන් පාඨ ඉහළින් තැබීම දේශපාලන තක්කඩිකමකි. මෙරට පොදු ජනතාවත් ප්‍රගතිශීලී සමාජ බලවේගත් පරෙස්සම් විය යුත්තේ එම තක්කඩිකම්වලට ගොදුරු නොවී සිටීමටය.

අනෙක් අතට ලංකාවේ ධනපති ක්‍රමය පවතිනතාක්, ධනපති ආණ්ඩුවක් හා ධනපති රාජ්‍යය පවතිනතාක් මර්දනයද තිබේ. එය ධනපති රාජ්‍යයේ හැටිය. ධනවාදයත් මේ බංකොලොත් නව ලිබරල් ආර්ථික ක්‍රමයත් පවත්වාගෙන යන ගමන් ප්‍රජාතන්ත්‍රවාදය වෙනම ආරක්ෂා කළ නොහැක. ප්‍රජාතන්ත්‍රවාදය අහෝසිවීම හා රාජ්‍ය මර්දනය, ආර්ථික අර්බුදයට මුහුණ දීමට ධනපති ආණ්ඩුව දරන ප්‍රයත්නය විසින්ම නිර්මාණය කරන්නකි. ඒ නිසා එය වෙනම හුදකලාව විසඳිය නොහැක.

අපේ රටත්, ජනතාවත් දැන් මුහුණ දී සිටින අභියෝගය වන්නේ කුමක්ද? ඒ වර්තමානයේ නිර්මාණය වී ඇති තවදුරටත් දරා සිටිය නොහැකි ප්‍රශ්න කිහිපයකි. අප නිවැරදිව හඳුනාගෙන විසඳුම් සෙවිය යුත්තේ එයටය.

මේ වන විට ලංකාවේ ආර්ථිකය පවතින්නේ විනාශයක අද්දරය. දැරිය නොහැකි ණය බර නිසා, විදෙස් සංචිත පහත වැටීම නිසා නිෂ්පාදන මාර්ග කඩාවැටී වත්කම් ඉපයීම අඩාලවී ඇති නිසා, රුපියල බාල්දුවීම නිසා, බඩු මිල ඉහළ යාම නිසා නිර්මාණය වී ඇති ආර්ථික විනාශයේ සමස්ත බර ජනතාවගේ කර මතට කඩාවැටීම දැන් සිදුවෙමින් තිබේ. ආණ්ඩුවේ වංචා, දූෂණ, නාස්තිය විසින් මෙය තවත් උග්‍රකරමින් තිබේ; රට විකුණමින් තිබේ. සැබෑ ඛේදවාචකය එයයි.

අනෙක් අතට දූෂිත පවුල් පාලනයක් අතට බලය ගොස් තිබේ. රට පාලනය කරන්නේත්, නීති හදන්නේත්, නීති කඩන්නේත් රාජපක්ෂ පවුලේ වුවමනාවන් හා කැමැත්තට අනුවය. එය බරපතළ ප්‍රශ්නයකි.

එසේම අධ්‍යාපනය, සෞඛ්‍ය සේවය, ගමනාගමනය ආදී මහජන සේවා බිඳවැටී, පරිපාලන අර්බුදයක්ද මතුව තිබේ. එය විසින්ද ජනතාව පීඩාවට පත් කරනු ලැබ ඇත.

බියවැද්දීම, මර්දනය හා ප්‍රජාතන්ත්‍රවාදය අහිමිවීම, නීතිය තමන්ට අවශ්‍ය ලෙස හැසිරවීමේ ගැටලුව ඊළඟට තිබේ. අප රටක් ලෙස මුහුණ පාන ප්‍රශ්න සියල්ලම මෙම ව්‍යසනයන් හා බැඳුණු ඒවාය. එබැවින් මෙම ව්‍යසනයෙන් ගැලවීමට නම් මේ ව්‍යසනයන්ගේ උල්පත වූ වත්මන් නව ලිබරල්වාදී ආර්ථිකයත්, ඒ මත ගොඩනැඟුණු සමාජ දේශපාලන සංස්කෘතියත් වෙනස් කළ යුතුය.

ඒ නිසා වත්මන් අර්බුදය ඉල්ලා සිටින්නේ සරල ආණ්ඩු මාරුවක් නොවේ. ආර්ථිකයේත්, සමාජ දේහයේත්, දේශපාලනයේත් ගැඹුරු පුළුල් පරිවර්තනයකි. එය කළ හැකි වන්නේ නිවැරදි ප්‍රතිපත්ති මාලාවක්, වැඩපිළිවෙළක් මත වමේ, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී සැබෑ දේශප්‍රේමී බලවේගවල නායකත්වයෙන් පොදු ජනතාව එකතු කිරීමෙන් හා පුළුල් මහජන ව්‍යාපාරයක් නිර්මාණය කිරීමෙනි. බලය හොබවා කිහිපවරක් අසමත් වූ, බල තණ්හාවෙන් පෙළෙන දේශපාලන ඔළුබක්කන්ට මෙරට ජනයා නොරැවටී සිටිය යුත්තේ මේ නිසාය.





YES WE CAN

# ළමා අපචාරවලට දායක වීම...

දැරියක් පිළිස්සී මියයාමත් සමඟ ළමා අපචාර සම්බන්ධ ඉතාම කෙටිකාලීන කතිකාවක් සමාජය තුළ නිර්මාණය වී ඇත. 'කෙටිකාලීන' යන වචනය භාවිතා කරේ ඉතා ඕනෑකමකින්ය. මන්දයත් අපේ රටේ සිදු වූ පළමු සිදුවීම මෙය නොවන නිසාය. එවැනි සිදුවීමක් ගැන කතාකරන්නේත්, මතක තියෙන්නෙත් ඉතා කෙටි කලක් පමණක් වීම නිසාය.

වසරකට ලෝකයේ ළමයින් බිලියන එකක් පමණ ළමා අපයෝජනයට ලක්වන අතර, එනිසා වසරකට ළමයි 50,000ක් පමණ මියයති. ශ්‍රී ලංකාවේ 2011-2014 වසර 04 තුළ සිදුවී ඇති ළමා අපයෝජන සංඛ්‍යාව 32,000 ඉක්මවයි. 2018 වර්ෂයේදී පමණක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වූ සිදුවීම් ගණන 9552කි.

ළමා අපයෝජනය යනු ළමයෙකුව ලිංගිකව අපයෝජනයට ලක්කිරීම හෝ මෙහෙකාර සේවයේ යොදවාගැනීම පමණක් නොවේ. ළමයෙකුගේ කායික හා මානසික තත්වයන්ට පිටස්තරව, ඔහුගේ හෝ ඇයගේ යහපතට, හා මනා කල්ක්‍රියාවට එරෙහිව සිදුකරන කුමන හෝ අයහපත් ක්‍රියාවක් ළමා අපයෝජනයකි. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන්නේ එය ශාරීරික අපයෝජනය, මානසික අපයෝජනය, ලිංගික අපයෝජනයක් හෝ නොසලකා හැරීමක් ලෙස හෝ සිදුවිය හැකි බවය.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ 2016 වසරට අදාළව කරන ලද සමීක්ෂණයකට අනුව ලෝකයේම දරුවන් අතරින් ශාරීරික අපයෝජනය හා ලිංගික අපයෝජනයට ලක්වන ප්‍රමාණය 41%ක් වෙද්දී, 52%ක් එනම්, දරුවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් අපයෝජනයට ලක්වන්නේ මානසික අපයෝජනය හා නොසලකා හැරීම යන වැඩි අවධානයකට ලක්නොවන ක්‍රමවලිනි.

දරුවන්ට නිසි පෝෂණයක් නොමැතිවීම, ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය නොසලකා හැරීම, නිසි අධ්‍යාපනයක් නොදීම, රැකවරණය නොලැබී යාම, ජීවත්වන පරිසරයේ යුදමය වාතාවරණ පැවතීම, ළමා මෙහෙකාර සේවය ඇතුළු දරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට අදාළ සියලු ක්‍රියාවන් ළමා අපයෝජන වේ.

2019 වර්ෂයේ දී පමණක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබුණු ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි සංඛ්‍යාව 8558ක් වූ අතර, එම වසරේ දී ශ්‍රී ලංකා පොලීසියට වාර්තා වී ඇති පැමිණිලි සංඛ්‍යාව 5130කි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සෑම පැය දෙකකට වරක්ම කුඩා දරුවකු මෙලෙස අපචාරයට ගොදුරු වේ. ළමා මෙහෙකාර සේවය, පැහැරගැනීම්, ජාවාරම්වලට යොදා ගැනීම්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා සිඟමනේ යෙදවීම එහිදී ඉහළ මට්ටමෙන් වාර්තා වූ අපයෝජන වර්ගයන්ය.

ලක්ෂ 45කට අධික, ලංකාවේ මුළු ළමා ජනගහනයෙන් 1%ක දරුවෝ මේ වනවිට ළමා ශ්‍රමිකයෝ වෙති. ළමා ශ්‍රමිකයන් සඳහා යොමු වී සිටින ඒ දරුවන් අතරින් 36%ක්ම අනතුරුදායක රැකියාවලද යෙදී සිටිති. ළමා ශ්‍රමය සඳහා යොමු වී තිබෙන පිරිසගෙන් 59%ක්ම ඒ සඳහා යොමුව තිබෙන්නේ පවුලේ ආර්ථික දුෂ්කරතා නිසයි. ඉෂාලිනීද ඉන් එක් දැරියකි.

2022 වන විට ළමයින් ගණිකා වෘත්තියේ යොදවා ගැනීම, යාචක කටයුතුවලට යොදවා ගැනීම, මත්ද්‍රව්‍ය වෙළෙඳාමට යොදවා ගැනීම, ළමයින් අපහරණය කිරීම යනාදී 'නරකම ආකාරයේ' ළමා ශ්‍රමය තුරන් කරන බවට ප්‍රතිඥා දී තිබෙන ශ්‍රී ලංකාව, 2021 අවසාන කාර්තුවට එලඹෙන්නේ රටට ප්‍රධාන වශයෙන් මත්ද්‍රව්‍ය ගෙන්වන කුඩු මුදලාලිලාට,මිනීමරුවන්ට ජනාධිපති සමාව දෙමිනි. ඉෂාලිනීගේ නඩුවද අතින් අත යවමින්, කල් මරණ රජය මෙරටේ දරුවන්ට යුක්තිය ඉටුකිරීම පසෙකලා කරන්නේ ඉෂාලිනීගේ ප්‍රශ්නයද තම පටු දේශපාලන අරමුණු වෙනුවෙන් පාවිච්චි කිරීමය.

ඉෂාලිනී රිෂාඩ් බදුර්දීන්ගේ එනම්, මුස්ලිම් මන්ත්‍රීවරයකුගේ ගෙදර සිටීම නිසා එය ජාතිවාදී ප්‍රශ්නයට පටු කිරීමය. ඒ විමල් වීරවංශ වැනි සිංහල මන්ත්‍රීවරුන්ගේ නිවෙස්වල මියගොස් සිටි තරුණයින් පිළිබඳ කිසි කතාවක් නැතිවය. විටින් විට වාර්තා වූ ළමා අපචාරවලට සම්බන්ධ මන්ත්‍රීවරුන්ට තම පක්ෂවල ආසන පිරිනමමින්ය. ඔවුන්ගේ නඩු යටගහමින්ය. තවත් ඉෂාලිනීලා බිහිවීමට අත්වැල් සපයමින්ය. ඉෂාලිනීට ඇගේ දරිද්‍රතාව නිසා අහිමි වූ අධ්‍යාපන වරම් රටේ අනිත් දරුවන්ටද අහිමි කිරීමට පිඹුරුපත් සකස් කිරීමය. මේවාද ළමා අපචාරවලට අනුබල දීම නොවේද? එවැනි පාලකයින් බලයට ගෙන ඒම ළමා අපචාරවලට දායක වීම නොවේද?

# සහෝදරත්වයේ දින සැමරුමට Online වැඩසටහන් මාලාවක්





"එක්ව අපි පියාඹමු" යන මැයෙන් මෙවරද 'සහෝදරත්වයේ දිනය' වැඩසටහන් රැසකින් යුක්තව පැවැත්විණි. පවතින කොවිඩ් වසංගතය හේතුවෙන් මෙවර බොහෝ වැඩසටහන් පැවැත්වීමට තීරණය කර තිබුණේ දුබකසබැ තාක්ෂණය ඔස්සේය. 2009 සිට මේ දක්වා වසර 12ක් පුරා නොකඩවා කළු ජූලිය වෙනුවට එම දිනය 'සහෝදරත්වයේ දිනය' ලෙස නම් කරමින් සමාජවාදී තරුණ සංගමය විසින් පවත්වාගෙන යනු ලබයි. එදා මෙදා තුර සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකත්වයන් තුළ සහෝදරත්වය ගොඩනැගීම උදෙසා විවිධ වැඩසටහන් රාශියක් මේ වන විට පවත්වනු ලැබ ඇත. විටෙක උතුරෙත්, විටෙක නැගෙනහිරත්, විටෙක දකුණේත් එම මතවාදයන් සමාජගත කිරීමට සමාජවාදි තරුණ සංගමය කටයුතු කළේය.

මෙවර ප්‍රධාන වැඩසටහන් 05ක් හා දිස්ත්‍රික් මට්ටමින්ද විවිධ වැඩසටහන් සංවිධානය කෙරිණි. ජූලි 20 වැනි දින 'මනුෂ්‍යත්වයේ කාව්‍යයම හෝරාව' නමින් ජාතික සමගිය ගොඩනැගීම උදෙසා කවිය අවියක් කරගත්තේ කේසේද යන්න සාකච්ඡා කෙරිණි, මෙම අවස්ථාවේදී ප්‍රවීණ ලේඛිකා සුහර්ෂණී ධර්මරත්න, කථිකාචාර්ය අනූ ශිවලිංගම් හා යොවුන් කවියකු වන ලහිරු කරුණාරත්න යන අය විසින් සංවාද මණ්ඩපය රසවත් කළහ. එය ශානික සිල්වා සහෝදරිය විසින් මෙහෙය වන ලදී. ජූලි 23 වැනි දින 'තවත් කළු ජූලියක් එපා, ජාතිවාදී උගුල, දේශපාලනය සහ අනාගතය' නමින් සජීවී වැඩසටහනක් පැවැත් විණි. මේ සඳහා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, පාඨශාලාචාරිනී සරෝජා පෝල්රාජ සහෝදරිය හා මාධ්‍යවේදී ප්‍රියදර්ශන දයාරත්න සහෝදරයා සහභාගි වූහ. එහි දී කළු ජූලියේ ඉතිහාසය, හා එහි සජීවී ඇත්දැකීම් බෙදාගන්නා ඉතා වැදගත් සංවාදයක් බවට එම වැඩසටහන පත් වූ අතර ගීත කිහිපයකින් එය තවත් ඔප්නැංවිය. නීතිඥ කොෂල්‍යා ආරියරත්න සහෝදරිය විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදී. තෙවැනි වැඩසටහන ජූලි 25 වැනි දින 'තවත් කළු ජූලියක් එපා' යන වැඩසටහනම දෙමළ භාෂාව මගින් පැවැත් විණි. ඒ සඳහා අරුන් හේමචන්ද්‍ර, යු.එල්. කියාස් සහ සදීෂ් සෙල්වරාජ් සහෝදරවරු එක්ව සිටියහ.

ජූලි 27වැනි දින 'ජාතිවාදී වෛරසයට එරෙහිව ආදරයේ ගීතය' නමින් හතර වන වැඩසටහන පැවැත්විණි. මේ සඳහා සහභාගි වූ ප්‍රවීණ සංගීතඥ නදීක ගුරුගේ, ප්‍රවීණ ගීත රචක නිලාර් එන්. කාසිම් යන කලාකරුවෝ ගීතය මගින් ජාතික සමගියට කළ මෙහවර පිළිබඳ පුළුල් සංවාදයක් ගොඩ නැගූහ. මෙම වැඩසටහන නිපුණා සාරංගි සහෝදරිය විසින් මෙහෙයවන ලදී. ප්‍රධාන වැඩසටහන්වල අවසන් වැඩසටහන වූයේ 'මානව ප්‍රේමයේ සිනමා පැතිකඩ' යන්නයි. එය ජූලි 30වැනි දින පැවැත් වූ අතර සිනමා හා ටෙලිනාට්‍ය අධ්‍යක්ෂක, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය සෙනෙෂ් දිසානායක බණ්ඩාර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ හිටපු කථිකාචාර්ය කපිල ජානක බණ්ඩාර යන විද්වතුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. මෙහිදී වර්ණ භේදවාදයට, ජාතිවාදයට එරෙහිව ලංකාව තුළත් ජාත්‍යන්තරය තුළත් බිහිවූ නිර්මාණයන් පිළිබඳ දිගහැරුණු කතාබහ ඉතා වැදගත් විය. මෙම වැඩසටහන මියැසි දිමෝෂා සහෝදරිය විසින් මෙහෙයවන ලදී.

මෙම ලිපිය ලියන මොහොතේදීත් සහ ඉදිරියේදී දිස්ත්‍රික් මට්ටමින් ජාතික සමගිය තේමාව කරගනිමින් විවිධ වැඩසටහන් පැවැත්වෙමින්, සංවිධානය වෙමින් තිබේ. මේ වන විට මහනුවර, හම්බන්තොට, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවල සංවාද, සම්මන්ත්‍රණ ආදි වැඩසටහන් පවත්වා අවසන්ව ඇත.









## බලා සිටිමුද තව කපක්...

බොහෝ බෝසත්
පෙරුම් පිරුවෝ..
බණ දෙසූහයි
බුදුන්..
යහපතුන් වනු වස්
රජුන්, වාසීන්
නොමැත්තේ ද
අකමැත්තේද
දෙසක් ඇත වැළලුණ
මිනී කඳු සමග
නෙක රෝපීඩා හා..
එනෙකුදු නොහී
රජෙක්, වැසියෙක්
බණ අසා හික්මුණු
දෙදහසක් තුන්දහසක්
වස් ගොස් ඇතත්..
රජුන් මිනි මෝරන්ව
දරුවන් මරා
මහ මඟ දමා
අතීත මළ කඳන් පවා
විකුණයි උනුන්ගේ
සේප්පුව පුරවා
වසා තදින්..
මළ දන් දෙනු රිසිව
බිලි පූජා..
රටක්, රාජ්‍යයක්, බිමක්..
නොරැක හෙටට මනුසත්,
බලා සිටිමුද තව වරක්
පහළ වන තෙක්
බෝසතුන්,
බුදු කෙනෙක්..
කල්පයක්...

UPDATE

## චීන ෂුරොන්ග් රෝවරය අඟහරු මත මීටර් 500ක් ගිහින්



චීනයේ ෂුරොන්ග් රෝවරය පසුගියදා අඟහරු පෘෂ්ඨය මත මීටර් 509 ක් ධාවනය කර ඇති බව වාර්තා වේ. මෙම ෂුරොන්ග් රෝවරය අඟහරු දින 63ක් පුරා එහි වැඩකරමින් සිටී. අඟහරුගේ දිනයක් පෘථිවියේ දිනකට වඩා මිනිත්තු 40 කින් පමණ දිර්ඝ වේ.

මේ අතර ටියැන්වෙන් 1 මෙහෙයුමේ ඕබිටර් යානය අඟහරු කක්ෂයේ දින 359 ක් පුරා වැඩ කරමින් සිටින අතර මේ වන විට රෝවරය හා ඕබිටර් යානය යන යාන දෙකම හොඳ තත්වයේ පවතින අතර සෑම උප පද්ධතියක්ම සාමාන්‍ය ක්‍රියාකාරීත්වයේ පවතින බව චීන අභ්‍යවකාශ ඒජන්සිය පවසයි.

## තවත් වසර 500 කින් පෘථිවියෙන් එහා ජීවත්වීමට අවස්ථාව



ඉදිරි වසර 500 කින් පසු පෘථිවියෙන් එහා වෙනත් ග්‍රහ ලෝකයක ජීවත් වීමට අවශ්‍ය වෙනස් වීම් සිදුකරගත යුතු බව ඇමරිකා එක්සත් ජනපදයේ ජාන විද්‍යා පිළිබඳ මහාචාර්ය ක්‍රිස් මේසන් පවසා සිටී.

ඔහු වැඩිදුරටත් පවසා සිටින්නේ පෘථිවිය යම් දිනෙක ජීවයට නුසුදුසු තත්වයක් වූ පසු මිනිසාට වෙනත් ග්‍රහ ලෝකයකට මාරුවීමට සිදුවන බවයි. මේ සඳහා තාක්ෂණික අභියෝග මෙන්ම ඒ තත්වයන්ට අනුකූල වන පරිදි ජානමය අභියෝගද ජයගත යුත වේ. මේ පිළිබඳ ඔහු කෘතියක්ද රචනා කර තිබේ.

## මෙවර ඔලිම්පික් පදක්කම් සියල්ලම ඉවතලන ජංගම දුරකතන උපාංගවලින්



ජපාන රජය පරිසර හිතකාමී ඔලිම්පික් උළෙලක් සහතික කිරීම සඳහා ඔලිම්පික් පදක්කම් නිර්මාණය කිරීම සඳහා ඉවතලන විද්‍යුත් භාණ්ඩ වන ජංගම දුරකතන හා පරිගණකවල කොටස් යොදා ගෙන ඇත.

ඔලිම්පික් පදක්කම් රන්, රිදී හා ලෝකඩ වශයෙන් 5000 ක් පමණ අවශ්‍ය වන අතර මෙයින් 90% ක්ම ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඒවාය. මේ සඳහා විශාල පිරිසක් දායකත්වය දක්වා ඇත. ඒ අනුව රත්තරන්, රිදී හා ලෝකඩ ටොන් 80 ක් පමණ එකතු කර ගැනීමට හැකියාව ලැබී ඇත.

## ඉදිරි දශක 02 තුළ දහන එන්ජිම භාවිතයෙන් ඉවතට



ඉදිරි වසර 20 තුළ පෙට්‍රල් සහ ඩීසල් මෝටර් රථ අලෙවිය අවසන් වන බවට සංඥා කරමින්, විදුලි මෝටර් රථ භාවිතයට මාරුවීම වේගවත් කරන යෝජනාවකට යුරෝපා සංගම් සූදානම් වේ.

බොහෝ මෝටර් රථ නිෂ්පාදකයෝ දැනටමත් විදුලිය සඳහා විශාල ආයෝජනයක් ප්‍රකාශයට පත් කර ඇති අතර, දැඩි විමෝචන ඉලක්ක වෙත සහය දැක්වීමට අපේක්ෂාවෙන් පසුවෙති. මෙම යෝජනා මගින් 2035 - 2040 සිට රටවල් 27 ක පොසිල ඉන්ධනවලින් ධාවනය වන වාහන විකිණීම තහනම් කිරීමේ සාකච්ඡාවක් සිදුවන අතර එහිදී සියලු යෝජනා යුරෝපා සංගම් සාමාජික රටවල් සහ යුරෝපීය පාර්ලිමේන්තුව විසින් සාකච්ඡා කර අනුමත කළ යුතුව තිබේ.

# ආණ්ඩුවේ 2/3 ඉක්මවූ ජන බලයක් මහපාරේ ගොඩනගන්න අපි සූදානම්



සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක
**රංගන දේවප්‍රිය සහෝදරයා**

***නියමුවා:-*** *පසුගිය මෛත්‍රී - රනිල් ආණ්ඩුව විසින් ගෙන ආ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත, කවරය පමණක් වෙනස් කොට වත්මන් ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව විසින්ද එලෙසම ඉදිරිපත් කරනු ලැබුවා. මේ පිළිබඳව ඔබේ කියවීම?*

*රංගන දේවප්‍රිය සහෝදරයා:-*

රටේ ආණ්ඩු පක්ෂය කුමක් වුවත්, නායකයා කවුරු වුවත් ධනේශ්වර වුවමනා සම්පූර්ණ කිරීම වෙනුවෙන් නිදහස් අධ්‍යාපනය බිලි දීමට ඔවුන් සූදානම්ව සිටියා. උදාහරණ විදිහට කිව්වොත් එ.ජා.ප.ය සහ ඊට සම්බන්ධ ආණ්ඩු මගින් ධවල පත්‍රිකාව, කිංස්ලි සිල්වා වාර්තා, උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල යෝජනා ගෙනාවා. ඒ වගේම ශ්‍රීල.නි.ප.ය හා ඒ හා සම්බන්ධ ආණ්ඩු මගින් ජයතිලක කමිටු වාර්තා, තාරා-හැරල්ඩ් වාර්තා, සයිටම් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වැනි යෝජනා ආවා. ඒ නිසා හරි පැහැදිලියි ආණ්ඩුව මාරු වුණාට, නායකයො මාරු වුණාට ඒ කිසිවෙක් අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ ධනවාදී ප්‍රතිපත්ති වෙනස් කළේ නැහැ. එකම යෝජනා මාලාව නම වෙනස් කරලා, එහෙම නැත්නම් දවටනය වෙනස් කරලා මාරුවෙන් මාරුවට ගෙනාවා. ඉතින් මේ අවස්ථාවේදීත් සිදුවෙලා තියෙන්නේ ඒකම තමයි. පසුගිය රනිල්-මෛත්‍රී ආණ්ඩුව රටේ අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමේ නව මාදිලියක් විදිහට මිලිටරි බලය හරහා එම කාර්ය ඉටුකර ගැනීම වෙනුවෙන් 2018 අප්‍රේල් මස 11වැනිදා මෙම පනත් කෙටුම්පත ගැසට් කළා. ඒත් මතුවුණු ජනතා විරෝධය හමුවේ එම පනත් කෙටුම්පත හකුළාගැනීමට ආණ්ඩුවට සිදු වුණා. එදා විපක්ෂයේ හිටපු වත්මන් ආණ්ඩු පක්ෂය පවා ඊට විරෝධතාවය දැක්වූවා. අද වත්මන් රාජපක්ෂ ආණ්ඩුව ඒ පනතේ එකදු අකුරක් හෝ වෙනස් නොකර නැවතත් පාර්ලිමේන්තුවට ගෙනවිත් තියෙනවා.

***නියමුවා:-*** *කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අදාළ නව පනත මගින් සන්නද්ධ හමුදාවල සහ රාජ්‍ය සේවයේ සේවය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන්ට සහ වෙනත් තැනැත්තන්ට අධ්‍යාපනය ලබා දීමට අරමුණු කර තිබෙනවා. මේ 'වෙනත් තැනැත්තන්' කියන්නේ කවුද?*

*රංගන දේවප්‍රිය සහෝදරයා:-* අපේ රටේ ත්‍රිවිධ හමුදා සඳහා අවශ්‍ය කරන වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් වැනි විශේෂ පුහුණුවක්, ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලැබූ පිරිස් බිහිකර ගන්න එක වෙනුවෙන් විශේෂ අධ්‍යාපන ආයතනයක් රටට අවශ්‍යයි කියන පදනම මත තමයි 80 දශකයේ මුල කොතලාවල ආරක්ෂක ඇකඩමිය ගොඩනැගුවේ. 1981 අංක 68 දරන පනතින් ඊට අදාළ කරන නීතීමය වටපිටාව හැදුවා. ඒ පනත ඇතුලෙ නිශ්චිතව සඳහන් කරලා තිබුණා මෙම ආයතනය නිර්මාණය කරන්නේ ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් පමණයි කියලා. පසුව 1988දි මේ පනතට සංශෝධනයක් ගෙනාවා ඇකඩමිය විශ්වවිද්‍යාලයක තත්වයට උසස් කරන්න. ඒ වුණත් මෙම ආයතනයට විශ්වවිද්‍යාලය කියන නම භාවිතා කරන්න ලැබෙන්නෙ 2007 ගෙනාව 2007 අංක 50 දරන සංශෝධනයත් සමගයි. මෙම සංශෝධන ගෙන ඒමේ ප්‍රධාන අරමුණ මෙම ආයතනය විශ්වවිද්‍යාලයක් ලෙස ක්‍රමානුකූලව ඉහළට ගෙන ඒම බව ප්‍රකාශ කෙරුණත් මේවා තුළ ඇති කරුණු පදනම් කරගනිමින්, විශේෂයෙන් 2007 සංශෝධනයෙන් පසුව මෙම ආයතනය තුළ ත්‍රිවිධ හමුදාවන්ට අයත් නොවන බාහිර පුද්ගලයන්ට උපාධි ලබාදීම ආරම්භ කළා. ඉන් කොටසක් විවිධ කොන්දේසි සහ එකඟතා මත නොමිලේ ලබා දුන්නා. ඉතිරි කොටස සඳහා මුදලට ලබාදුන්නා.

මේ ආයතනය රාජ්‍ය මැදිහත්වීම සහිතව අධ්‍යාපනය විකුණන ආයතනයක් බවට පත්වුණේ එහෙම. අද මෙම නව පනත තුළ එලෙස උපාධි මුදලට ලබාදීමේ හැකියාව ගැන පැහැදිලිවම සඳහන් කරලා තියෙනවා. කලින් විවිධ නීතිමය හිඩැස් භාවිතා කරලා ඒ ක්‍රියාව සිදුකළා වුණත් දැන් මෙම පනත මගින් ඒ සඳහා ඍජුවම ඉඩ විවර කර තියෙනවා. ඉතින් ඒ අධ්‍යාපනය විකිණීමට අදාළ කරන වෙළඳපළ පුළුල් කරගැනීම තමයි ඔය කියන වගන්තියෙ 'වෙනත් පුද්ගලයන්' කියන වචනය භාවිතා කරලා සිදුකරලා තියන්නෙ. ඇත්තටම යම් කිසි පාර්ශවයක් නිශ්චිත කරලා කියලා, ඉන් පරිබාහිර සියල්ලත් ඊට ඇතුලත් කියන එකෙන් කියන්නේ ඒ යටතට සියල්ල අයත් කියන එක.

***නියමුවා:-*** ***මේ පනත සම්බන්ධ ප්‍රබලම චෝදනාව වන්නේ, එමගින් පවතින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හා සමාන්තර උපාධි පිරිනැමීමේ බලතල සහිත තවත් ව්‍යුහයක් මෙමගින් ගොඩනැගෙන බවයි. ඒ පිළිබඳව අදහස් දැක්වූවොත්.***

*රංගන දේවප්‍රිය සහෝදරයා:-* ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය ගත්තොත් සිසුන් ඇතුලත් කරගැනීම, ශිෂ්‍යයෙක් උපාධිධාරියෙක් වීමට සුදුසුකම් ලැබීම, විභාග පැවැත්වීමේ සහ වෙනත් ඇගයීම් ක්‍රමවේද තීරණය කිරීම ආදිය පිළිබඳව නිර්ණායක සකස් කිරීම ඇතුළුව ශිෂ්‍යයෙක් උපාධිධාරියෙක් දක්වා සංවර්ධනය කිරීමට අදාළ මූලික ප්‍රතිපත්තිමය තීරණ ගන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන්. ඒ වගේම තමයි අපේ රටේ විශ්වවිද්‍යාල සඳහා පිළිගැනීම ලබාදීම, ඒවායෙහි පිරිනැමිය හැකි උපාධි සම්බන්ධව තීරණය කිරීම, එම උපාධිවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම ආදිය සිදු කරන්නේත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙනුයි. ඒ වගේම කථිකාචාර්යවරුන්, ආචාර්යවරුන්, මහාචාර්යවරුන් බිහිකිරීමේ ක්‍රියාවලියත් එහි අධීක්ෂණය යටතේ සිදුවන්නක්. ඒත් මෙම පනත මගින් මෙම සියලු බලතල කොතලාවල විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට ඉහළින් නිර්මාණය කරන පාලක මණ්ඩලයට ලබාදෙනවා. මෙතෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තිබූ බලය බිඳලා තියෙන්නෙ ඒ විදිහටයි.

ඒ වගේම තමයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නැති, ඉන් එහා ගිය බලතලත් මෙම ආයතනයට තියෙනවා. පාසල්, විද්‍යාල බිහිකිරීමේ බලය, ශික්ෂණ රෝහල් ආදිය ගොඩනගා පවත්වාගෙන යාමේ බලය ආදිය ඉන් කිහිපයක්.

***නියමුවා:-*** ***මේ පනත මගින් අධ්‍යාපනය මිලිටරිකරණය වීමට ඉඩ විවර වන බවට විවේචනයක් ගොඩනැගෙන්නේ ඇයි?***

*රංගන දේවප්‍රිය සහෝදරයා:-* අපි කලින් කතාකරපු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු බලතල වගේම ඉන් එහා ගිය, වෙනත් ආයතන සතු බලතලත් සහිත පාලක මණ්ඩලයක් මෙයින් බිහි වෙනවා. මෙම පාලක මණ්ඩලය නවදෙනෙක්ගෙන් සමන්විතයි. ඉන් 07ක් ආරක්ෂක අමාත්‍යාංශයට සහ ත්‍රිවිධ හමුදාවන්ට සම්බන්ධ පුද්ගලයින්. මෙවැනි මණ්ඩලයකට තමයි රටේ අධ්‍යාපනය සම්බන්ධව තීන්දු ගැනීමේ යාන්ත්‍රණයක් භාර කරලා තියෙන්නෙ. ඒ වගේම තමයි කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වීමට බලපාන සුදුසුකම් සම්බන්ධව පනතේ සඳහන් වෙන්නේ අධ්‍යාපන සුදුසුකම් නෙවෙයි. ඔහුගේ හමුදා නිලයයි ඊට අදාළ වෙන්නෙ. යුද හමුදාවේ නම් මේජර් ජනරාල්, නාවික හමුදාවේ නම් රියර් අද්මිරාල්, ගුවන් හමුදාවේ නම් එයාර් වයිස් මාර්ෂල් කියන නිලයන්ගෙන් ඉහළ අයෙක් නම් ඔහු උපකුලපති තනතුරට සුදුසුකම් ලබනවා. මේ යෝජනා කරන්නේ හමුදා පුහුණු කිරීමක් නම් ඒ ගැන සලකා බලන්න පුළුවන්. ඒත් මේ කතාකරන්නේ සාමාන්‍ය සිවිල් පුරවැසියන්ටත් අධ්‍යාපනය ලබාදීමේ යාන්ත්‍රණයක් නිසා වීම තමයි මෙය ගැටලුකාරී වෙන්නෙ. ඒ විතරක් නෙවෙයි අවසාන වශයෙන් මෙම මිලිටරි බහුතරයක් හා සම්බන්ධ පාලක මණ්ඩලය වගකියන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට; අධ්‍යාපන අමාත්‍යාංශයට නෙවෙයි. මේ සියලු හේතු පදනම් කරගෙන තමයි අපි කියන්නේ මේ මගින් අධ්‍යාපනය මිලිටරිකරණය වීමක් වෙනවා කියලා.

***නියමුවා:-*** ***පනතට එරෙහි විරෝධතා උත්සන්න වීමත් සමග ජනාධිපතිවරයා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, විශ්විවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතට ගැනීමට ඇති බාධා ඉවත් කිරීමට බලාපොරොත්තු වන බව පැවසුවා. ඇයි මේ?***

*රංගන දේවප්‍රිය සහෝදරයා:-* ආණ්ඩුවට අවශ්‍ය වෙලා තියෙන්නෙ අධ්‍යාපන ක්ෂේත්‍රයට සහ ශිෂ්‍යයින්ගේ හෙට දවසට මොන තරම් බලපෑමක් සිදුවුනත් කුමන හෝ ආකාරයකට තමන්ගෙ වුවමනාකම් සම්පූර්ණ කරගන්න. කොතලාවල පනත කියන්නේ නිදහස් අධ්‍යාපනයේ අනාගතයට බරපතළ තර්ජනයක්. ඒ අනතුර ආරක්ෂා කරන්න විශ්වවිද්‍යාල පනත වෙනස් කරලා සමස්ත අධ්‍යාපනයම බිල්ලට දෙන්න හදනවා කියන්නේ ඒ බරපතළකම තවත් කිහිප ගුණයකින් වැඩිවෙනවා කියන එක. එක කඩතොලුවක් මකන්න ගිහිල්ලා තවත් කඩතොලු ගණනාවක් හදනවා කියන එකයි.

කොතලාවල පනත මගින් යෝජනා කරන්නේ අධ්‍යාපනය මිලිටරීකරණය කිරීම සහ පුද්ගලීකරණයට පාරක් කපන එක. ඒ අතරම 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පවතින විශ්වවිද්‍යාලත් වෙනමම පවතිනවා. ඒත් කොතලාවල පනත වෙනුවෙන් විශ්වවිද්‍යාල පනත වෙනස් කරනවා නම් එහි හානිය සමස්ත උසස් අධ්‍යාපන පද්ධතියටම අත්වෙනවා. මොකද එහෙම වුණොත් කොතලාවල පනතෙ තියෙන කරුණු විශ්වවිද්‍යාල පනතටත් ඇතුලත් වෙන නිසා. ඒ නිසා සමස්ත විශ්වවිද්‍යාල පනතම වෙනස් කරන්න වෙනවා කොතලාවල පනතට අනුව. ඒත් ඒක කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. මේ ව්‍යුහ දෙක එකිනෙකට හාත්පසින්ම වෙනස්. ඒ නිසා අපි තේරුම්ගන්න ඕන දේ තමයි කොතලාවල පනත වෙනුවෙන් 1978 විශ්වවිද්‍යාල පනත වෙනස් කරනවා කියලා ආණ්ඩුව කියන්නේ ජනතාව රවට්ටන්නයි; මේ වන විට නැගෙමින් තිබෙන විරෝධය යටපත් කරන්නයි.

***නියමුවා:-*** ***ආණ්ඩුව මේ පනත සම්මත කිරීම අගෝස්තු මාසය තෙක් කල් තබා තිබෙනවා. ඒ සම්බන්ධ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මතය?***

*රංගන දේවප්‍රිය සහෝදරයා:-* පසුගිය ආණ්ඩුව මෙම පනත ගෙන එන අවස්ථාවේ වගේම මේ අවස්ථාවේදීත් නැගුණ විරෝධතා නිසා කොතලාවල පනත පිළිබඳ පාර්ලිමේන්තු ඡන්ද විමසීම කල්දාන්න ආණ්ඩුවට සිදුවුණා. ඒ අතර ආණ්ඩුව මේ මොහොතේ උත්සාහ කරමින් ඉන්නවා, පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවක් බවට පත්කරගෙන නැගෙමින් එන විරෝධය යටපත් කරන්න. ඒත් අපිට දවසින් දවස දකින්න ලැබෙන්නෙ විවිධ සංවිධාන තව තවත් මේ අරගලයත් එක්ක ඒකරාශී වෙමින් සිටිනවා කියන කාරණය. ඒ බලවේග සියල්ල සමග එක්ව සටන් කරන්න සමාජවාදී ශිෂ්‍ය සංගමය ලෙස අපත් මැදිහත්වෙලා සිටිනවා.

ආණ්ඩුව හිතන්න පුළුවන් පාර්ලිමේන්තුවේ තමන් සතුව 2/3ක බලයක් පවතින නිසා කෙසේ හෝ මෙම පනත සම්මත කරගන්නවා කියලා. ආණ්ඩුවට අපි කියනවා අගෝස්තු 06වැනිදා පාර්ලිමේන්තුව ඇතුලේ මොන සෙල්ලම් දැම්මත් ආණ්ඩුවේ 2/3 බලයට එහා ගිය ජන බලයක් අපි මහපාරේ, ජනතාව එක්ක ගොඩනගන්න සූදානම් කියලා. ඒ නිසා තවත් සංශෝධන රැවටිලි අවශ්‍ය නැහැ, අපේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරන, මිලිටරීකරණය කරන කොතලාවල පනත සම්පූර්ණයෙන්ම හකුළාගන්නා ලෙස අපි ආණ්ඩුවට බලකර සිටිනවා.

> කොතලාවල පනත කියන්නේ නිදහස් අධ්‍යාපනයේ අනාගතයට බරපතළ තර්ජනයක්. ඒ අනතුර ආරක්ෂා කරන්න විශ්වවිද්‍යාල පනත වෙනස් කරලා සමස්ත අධ්‍යාපනයම බිල්ලට දෙන්න හදනවා කියන්නේ ඒ බරපතළකම තවත් කිහිප ගුණයකින් වැඩිවෙනවා කියන එක. එක කඩතොලුවක් මකන්න ගිහිල්ලා තවත් කඩතොලු ගණනාවක් හදනවා කියන එකයි.

# විප්ලවය රැකගැනීමට දේශප්‍රේමී කියුබානු ජනතාව පෙරට

ජූලි 11 වැනි දින , සමාජ මාධ්‍ය ජාලා හරහා සම්බන්ධීකරණය කෙරෙන්නා සේ පෙණුන සමාජවාදී ආණ්ඩුවට එරෙහි විරෝධතා ගණනාවක් කියුබාව පුරා එකවිට සිදුවිය. ප්‍රදේශ කිහිපයකදීම, විශේෂයෙන් කොවිඩ් 19 ආසාදිතයන්ගේ සංඛ්‍යාව ඉහළ යමින් තිබූ හවානා නුවර ආසන්නයේ සැන් අන්තොනියෝහිදී සහ මටන්සාස්හිදී කඩ සාප්පුවලට අලාභ හානි සිදු කරමින්, භාණ්ඩ කොල්ලකෑම් සිදු කරමින් වාහනවලට අලාභ හානි සිදු කරමින් හා පහරදීම් සිදු කරමින් මෙම උද්ඝෝෂණ ප්‍රචණ්ඩ ස්වරූපයකට පත් විය.

ජාත්‍යන්තර මාධ්‍ය කියුබාවේ සමාජවාදී ආණ්ඩුවට එරෙහි දැවැන්ත මහජන විරෝධතා ලෙස, සාමකාමී උද්ඝෝෂණවලට පොලිස් මර්දනය එල්ල වීමක් ලෙස හා බල අර්බුදයක් ලෙස හුවා දැක්වීම සඳහා මෙම සිදුවීම් අතිශයෝක්තියෙන් වාර්තා කරන ලදී. ඒ අතරම එක්සත් ජනපද සම්බාධකවල විනාශකාරී බලපෑම් සහ ලක්ෂ ගණනින් කියුබානුවන් එරට සමාජවාදී පාලනයට සහය පළකරමින් සිදුකළ උද්ඝෝෂණ මෙම ජාත්‍යන්තර මාධ්‍ය මගින් හිතාමතාම පළකිරීමෙන් වැළකී සිටියේය. එසේ නැතිනම් එම සිදුවීම් නොසලකා හරින ලදී.

### මැලිකොනාසෝ නැගිටීම

ඇමෙරිකා මහාද්වීපයේ බොහෝ රටවල මරණ හා තුවාල සිදුවන, සිය ගණනින් අත්අඩංගුවට ගැනීම් සිදු කෙරෙන එවැනි සමාජ ව්‍යාකූලත්වයන් බහුලය. නමුත් කියුබාව තුළ මෙවැනි විරෝධතාවන් මීට පෙර අවසන් වරට මතුවූයේ 1994දීය. මැලිකොනාසෝ නැගිටීම ලෙස හඳුන්වන එය ඇතිවූයේ 'විශේෂ කාල පරිච්ඡේදය ' ලෙස හඳුන්වන සමයේදීය. සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් පසු කියුබාවට බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ දීමට සිදුවිය.(කියුබාවේ විදේශ වෙළඳාමෙන් 90%ක් සමාජවාදී කඳවුරේ රටවල් සමග සිදු විය.) දළ ජාතික නිෂ්පාදිතය 35%කින් කඩා වැටුණි. කියුබානු ආර්ථිකය තවදුරටත් වැට්ටවීම සඳහා එක්සත් ජනපදය 1992දී Torricelli පනතත්, 1996දී Helms Burton පනතත් බලාත්මක කරමින් එක්සත් ජනපද සම්බාධක තවදුරටත් තීව්‍ර කරන ලදී; ලෝකයේ අනෙකුත් රටවල් සමග වෙළඳාමට බාධා පමුණුවන ලදී. මේ සමයේදී සුභසාදනයට සම්පත් යෙදවීම දුෂ්කර වූ අතර කියුබානුවන්ට ආහාර, ඉන්ධන, ඖෂධ , නිවාස, කර්මාන්ත, ප්‍රවාහනය ආදී සෑම ක්ෂේත්‍රයකම හිඟයන්ට මුහුණ පෑමට සිදු විය. ජීවිතය දුෂ්කර විය.

එවැනි තත්වයක් යළිත් වරක් කියුබාව තුළ මතුවී ඇත්තේ එක්සත් ජනපද සම්බාධක වල ඍජු ප්‍රතිපලයක් ලෙසය. බැරක් ඔබාමාගේ තාවකාලික සහනයන් ආපසු හරවමින් ඩොනල්ඩ් ට්‍රම්ප් පාලනය සම්බාධක පෙර නොවූ විරූ මට්ටමකට උත්සන්න කළේය. 2016 වසරෙන් පසු  නව සම්බාධක 243ක් ගෙන ආ ට්‍රම්ප් පාලනය කියුබාව ලෝකය සමග සිදු කරන වෙළඳාම නවතා දැමීම සඳහා මැදිහත් විය. කියුබාවට ඉන්ධන ගෙන ආ නෞකාවලට දඩ නියම කළේය. විදේශීය ආයෝජකයින් බිය ගන්වන ලදී. එක්සත් ජනපදයේ වෙසෙන කියුබානුවන් විසින් කියුබාවට මුදල් එවීම නවත්වා දමනු ලැබූ අතර සිය ඥාතීන් දැක බලා ගැනීමට පැමිණීමද නවතා දමන ලදී. එක්සත් ජනපද ඩොලරයේ ආධිපත්‍යය දරන ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියට කියුබාවට ඇතුළු වීමට ඇති ඉඩකඩ අවහිර කරන ලදී.

කොවිඩ් 19 වසංගත තත්වය ආරම්භයෙන් පසුව පමණක් මෙවැනි බලහත්කාරී පියවරයන් 50කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලදී. එමගින් කියුබාවට ස්වසනාධාරක යන්ත්‍ර, සිරින්ජයන්, ඖෂධ, එන්නත් හා ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, ආහාර සහ ඉන්ධන ආනයනය වළක්වාලනු ලැබීය. ජාත්‍යන්තර වෛද්‍ය ආධාර පවා නවතා දමන ලදී. එසේ තිබියදී පවා, දෛනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට කියුබානුවන්ට පෝලිම් වල රැඳී සිටීමට තිබියෙදී පවා ඔවුන් කොවිඩ් 19 වසංගතයෙන් පීඩාවට පත් රටවල් 40කට වැඩි ප්‍රමාණයකට සිය වෛද්‍ය බළකායේ ආධාර ලබා දීමට සමත් වූ අතර ලතින් ඇමෙරිකානු කලාපය තුළ කොවිඩ් 19 රෝගය සඳහා එන්නත් නිපදවූ එකම රට බවටද පත් විය.

### සමාජ මාධ්‍ය ජාලා ව්‍යාපාර

එක්සත් ජනපද සම්බාධක හා කොවිඩ් 19 වසංගතය යන සාධක දෙකෙහිම බලපෑම නිසා 2020 වසරේදී කියුබාවේ දළ ජාතික නිෂ්පාදිතය 11%කින් කඩා වැටුණි. 2019 වසරට සාපේක්ෂව සංචාරක කර්මාන්තය 75%කින් ද ආනයනයන් 30% කින්ද අඩු විය. මේ තත්වය භාණ්ඩ හිඟයට හා පෝලිම් ඇති වීමට බලපෑවේය. ඒ සමගම එක්සත් ජනපද කොංග්‍රස් මණ්ඩලයේ අනුමැතියෙන් සැපයෙන ඩොලර් මිලියන ගණනක ආධාර මත මියාමිහි සිට සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් ආරම්භ කරන ලද්දේ මෙම දුෂ්කරතාවන්ගේ වගකීම කියුබාවේ සමාජවාදී ආණ්ඩුව වෙත පැටවීමටය. මෙම දුෂ්කරතාවලට හේතුව එක්සත් ජනපද සම්බාධක නොවන බව හැඟවීමටය. මෙම සමාජ මාධ්‍ය ජාලා ව්‍යාපාරයේ අරමුණ වූයේ එක්සත් ජනපද සම්බාධක විසින් ඇති කරන ලද කියුබානු ජනතාවගේ ජන ජීවිතයේ දුෂ්කරතා රට තුළ දේශපාලන විරුද්ධ පක්ෂයක් ගොඩ නැගීම වෙත යොමු කිරීමය.

2020 වසරේ අග භාගයේ සිට මෙම සමාජ මාධ්‍ය ජාලා ව්‍යාපාරය කියුබානුවන්ගෙන් වීදි බසින ලෙසට ඉල්ලා සිටි අතර ප්‍රචණ්ඩ ක්‍රියා, කලකෝලාහල රූප ගත කර එවන්නන්ට මුදල් ආධාර පිරිනැමීමට ඉදිරිපත් විය. ජූලි 13වැනි දින පැවති ජාත්‍යන්තර මාධ්‍ය සාකච්ඡාවේදී කියුබානු විදේශ ඇමතිවරයා මේ පිළිබඳව නිශ්චිත තොරතුරු හෙළිදරව් කර සිටියේය. මියාමි පදනම් කරගත් මෙම මාධ්‍ය ජාලා ව්‍යාපාරය විසින් ජූලි 05වන දින කියුබාව තුළ 'මානුෂීය මාවතක්' ගොඩනැගීමට යෝජනා කරන ලදී. ජූලි 10 සහ 11 යන දෙදින එක් අයෙකු ට්විටර් ගිණුම් කිහිපයක් යොදා ගනිමින්, තත්පරයකදී පණිවුඩ 05ක් පමණ යවමින්  හා ඔවුන්ගේ



භෞමික ස්ථානගත වීම කියුබාව ලෙස වෙනස් කර ගනිමින් කියුබාව තුළත් ආර්ජන්ටිනාවේ , ඊජිප්තුවේ මෙන් දැවැන්ත ජනතා උද්ඝෝෂණ පැවැත්වෙන බව ඇඟවීමට උත්සාහ දරන ලදී. ජූලි 15 වන දින එක්සත් ජනපද සමාගමක් මගින #SOSCUBA නමින් කියුබාවට මානුෂීය ආධාර ඉල්ලන සමාජ මාධ්‍ය ජාලා ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර එදිනම ඒ සඳහා එක්සත් ජනපද රාජ්‍ය අරමුදල් ලබා දීමට අනුමැතියද ලැබුණි.

1960 වසරේ අප්‍රියෙල්  06වැනි දින එවකට අන්තර් ඇමෙරිකානු කටයුතු පිළිබඳ එක්සත් ජනපද උප සහකාර රාජ්‍ය ලේකම් ලෙස්ටර් මැලෝරි විසින් යොමු කරන ලද රහස්‍ය සංදේශයක මෙසේ සඳහන් වී තිබුණි. " සාගින්න හා අපේක්ෂාභංගත්වය ඇතිකර ආණ්ඩුව පෙරළා දැමීම සඳහා කියුබාවේ ආර්ථිකය දුර්වල කරන්න." මෙම ප්‍රකාශයේ වර්තමාන අනුවාදය වන්නේ සම්බාධක හා සමාජ මාධ්‍ය ජාලා යුද්ධය බව මේ අනුව පෙනී යයි.

### විප්ලවය රැක ගැනීම වෙනුවෙන් ජනතාව වීදියට

කියුබානු ජනාධිපති මිගෙල් ඩයස් කනෙල් ජූලි 11වැනි දින සිද්ධීන්ට ප්‍රතිචාර දක්වන ලද්දේ 1994දී මෙලිකොනාසෝ නැගිටීමේදී ෆිදෙල් කස්ත්‍රෝ මැදිහත් වූ ආකාරයටයි. ඔහු සැන් ඇන්තෝනියෝ ප්‍රදේශයේ ජනතාව හමුවට ගොස් ඔවුන් මුහුණ පා සිටින ප්‍රශ්න පිළිබඳ විමසා බැලූ අතර ඔවුන්ගේ ප්‍රශ්න හඳුනා ගැනීම සඳහා ප්‍රදේශයේ සංචාරයක නියැළුණි.

පැය කිහිපයකට පසුව ඔහු රූපවාහිනිය මගින් ඇතිවූ සිදුවීම් පිළිබඳ කියුබානු ජනතාවට පැහැදිලි කළ අතර කියුබානු ජනතාව මුහුණ පා සිටින දුෂ්කරතාවලට හේතු වූ එක්සත් ජනපද සම්බාධක හා ජනතාව උසි ගැන්වීම සඳහා සකස් කළ සමාජ මාධ්‍ය ජාලා වැඩ පිළිවෙළ හෙළා දැක්කේය. ඒ අතරම විප්ලවය රැක ගැනීම සඳහා වීදි බසින ලෙසට කියුබානු ජනතාවට ආයාචනා කළේය. ඊට ප්‍රතිචාර වශයෙන් රට පුරා නගරවලට දස දහස් ගණන් කියුබානු ජනතාව විප්ලවය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් එක්රැස් වූහ.

පසු දින රට පුරා දැඩි නිශ්චලත්වයක් පැවති නමුත් හවානා නුවර ආසන්නයේ ස්ථානයකදී ප්‍රචණ්ඩ උද්ඝෝෂණයක් ඇති විය. එහිදී පොලීසිය සමග ගැටුමින් එක් පුද්ගලයෙක් මිය ගිය අතර පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකු තුවාල ලබා තිබුණි. ඉන්පසු සුළු ගැටුම් කිහිපයක් පමණක් වාර්තා වී තිබුණි. මේ තත්වය තුළ අන්තර්ජාලය තාවකාලිකව වසා දැමුණු අතර ඉන් සමාජ මාධ්‍ය ජාලා මගින් අමතර ගැටුම් නිර්මාණය කරවීම වැළකී ගියේය.

මේ අතර එක්සත් ජනපද ජනාධිපති ජෝ බයිඩන් කියුබාවේ තත්වය පිළිබඳ ප්‍රකාශයක් සිදු කරමින් පවසා සිටියේ කියුබානු ආණ්ඩුව ජනතාවට ඇහුම්කන් දිය යුතු බවය. නමුත් බයිඩන් කියුබානු ජනතාවගේ දුෂ්කරතා පිළිබඳ අවංකව සැලකිලිමත් වන්නේ නම්, කියුබානු ජනතාවට ඇහුම්කන් දෙන්නේ නම් ඔහු කළ යුත්තේ කියුබාවට පනවා ඇති එක්සත් ජනපද සම්බාධක ඉවත් කිරීමය. ජූලි 17වැනි දින විප්ලවය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් හවානා නුවරට රැස් වූ ලක්ෂ 02කට වැඩි ජනතාවද, විප්ලවය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් රට පුරා නගරවලට රැස් වූ දස දහස් ගණන් ජනතාවද ඉල්ලා සිටියේ වහාම එක්සත් ජනපද සම්බාධක අහෝසි කරන ලෙසයි.

කියුබාවේ මේ මොහොතේ ඇති වී ඇති තත්වය පිළිබඳ අදහස් දක්වන, ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියක වන චේ ගුවේරා සහෝදරයාගේ දියණිය, ඇලෙයිදා ගුවේරා මෙසේ ප්‍රකාශ කර තිබුණි.

"කියුබානු විප්ලවය පරිපූර්ණ එකක් නොවන නමුත් මෙම ගැටලුව විසඳීමට අයිතිය ඇත්තේ කියුබානුවන් වන අපට පමණි. සමහර විරෝධතාකරුවන් විදේශීය බලවතුන්ගේ මැදිහත් වීමක් ඉල්ලා සිටි විට කියුබානුවන් අතර ඇතිවූ හැඟීම ඔබට සිතා ගත හැකිද? තවමත් වටහා ගෙන නැති දෙය නම් කියුබානුවන් ඉතා ඉහළ ආත්මාභිමානයෙන් යුතු ජනතාවක් බවය. අපගේ ජාතිකාභිමානය ගැන යමෙක් ප්‍රශ්න කරන විට අපේ රටේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගැනීමට අපි එක්සත් වෙමු.

අපට නිවාස සම්බන්ධ ගැටලු රාශියක් ඇත. පොදු ප්‍රවාහනයේදී අපට බරපතළ දුෂ්කරතා ඇති අතර දැන් කොවිඩ් වසංගතය සෑම තැනකම බොහෝ දෙනෙකුට දුක් වේදනා ගෙන දෙයි. මේ සියල්ලටම වඩා එක්සත් ජනපද රජය වසර 60කට ආසන්න කාලයක් තිස්සේ කියුබාවට එරෙහිව පවත්වා ගෙන ගිය ආර්ථික සම්බාධක තවදුරටත් තීව්‍ර කර ඇති අතර එහි ප්‍රතිපලයක් ලෙස ප්‍රතිජීවක ඖෂධ හා සිරින්ජ වැනි වෙනත් වෛද්‍ය උපකරණ හිඟයක් ඇති වී ඇත. පිටතින් මුදල් ප්‍රේෂණ පැමිණීම වැළැක්වීමට එක්සත් ජනපදය මගින් පනවා ඇති මූල්‍ය සම්බාධක හේතුවෙන් අපට අවශ්‍ය ආහාර මිලදී ගැනීමට විදේශ මුදල් නොමැති වී ඇත.

එක්සත් ජනපදය මෙම අවහිරය පවත්වා ගෙන යන්නේ නම්, එක්සත් ජනපද රජය මගේ රටේ ජනතාවගේ සුභසාධනය ගැන අව්‍යාජ සැලකිල්ලක් දක්වන බවට කිසිවෙකුට මට ඒත්තු ගැන්විය හැකිද? මම අවංකවම තේරුම් ගැනීමට අසමත් වෙමි."

## පේරු: වාමාංශික නව ජනාධිපතිවරයා දිවුරුම් දී



ස්පාඤ්ඤයෙන් නිදහස ලබා වසර 200ක් පිරුණු ජූලි 28 වන දින පේරු හි නව ජනාධිපතිවරයා ලෙස පෙද්‍රෝ කැස්ටිලෝ දිවුරුම් දුන්නේය. එරට මැතිවරණ ජූරි සභාව වාමාංශික අපේක්ෂක පෙද්‍රෝ කැස්ටිලෝ නව ජනාධිපතිවරයා ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කළේ පීරු ජනාධිපතිවරණයෙන් මාස 1 1/2කට පමණ පසුව, එනම් ජූලි 19වැනි දිනයි.

ජනාධිපතිවරණයෙන් 50.126%ක ප්‍රතිශතයක් ලබා ගනිමින් ඔහු ජයග්‍රහණය කර තිබූ අතර ප්‍රතිවාදී දක්ෂිණාංශික අපේක්ෂක කෙයිකෝ ෆුජිමොරිට වඩා ඡන්ද 44,263ක ප්‍රමාණයක් ලබා ගෙන තිබුණි. මෙම ප්‍රතිඵලය ප්‍රතික්ෂේප කළ කෙයිකෝ ෆුජිමෝරි මැතිවරණ ජූරි සභාව හමුවේ ලක්ෂ 02ක පමණ ඡන්ද අවලංගු කරන ලෙස ඉල්ලමින් මැතිවරණ පෙත්සමක් ගොනු කර තිබුණි.

## බ්‍රිතාන්‍යය: අර්බුද හමුවේ පොලීසියට වැඩි බලතල




පොලීසියේ අපරාධ, දඬුවම් විධිවිධාන හා උසාවි පනත් කෙටුම්පත නමින් පසුගිය ජූලි 05වැනිදා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේදී සම්මත කරගත් පනත මගින් පොලීසියට උද්ඝෝෂණ හා මහජන රැස්වීම් පාලනය සඳහා අත්තනෝමතික බලයක් ලබා දී තිබේ.  මෙම පනතට එරෙහිව 'පනත ඉරා දමනු!' නමින් දැවැන්ත විරෝධතා ක්‍රියාමාර්ගයක් ගත්තද එය නොසලකමින් එම පනත සම්මත කරගෙන තිබුණි. පනතට පක්ෂව ඡන්ද 365ක්ද විරුද්ධව ඡන්ද 265ක්ද ලැබී තිබුණි. (බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මුළු ආසන ගණන 650කි) මෙම පනත ක්‍රියාත්මක වුවහොත් එමගින් පොලීසියට උද්ඝෝෂණ 'මහජන ඝෝෂාවන්' ලෙස නම් කර දඬුවම් කළ හැකි වේ. එසේම උද්ඝෝෂණ සඳහා ආරම්භක හා අවසන් වෙලාවල් නියම කිරීමටද ශබ්ද සීමාවල් පැනවීමටද පොලීසියට ඉඩ කඩ ලැබේ.

## මියන්මාරය: වෘත්තීය සමිති ලෝක ප්‍රජාවගෙන් සම්බාධක ඉල්ලමින්



මියන්මාරයේ විශාලතම වෘත්තීය සමිති සන්ධානය වන 'මියන්මාර් වෘත්තීය සමිති සම්මේලනය' පසුගිය ජූලි 24වනදා මියන්මාරයේ හමුදා පාලනයට එරෙහිව සම්බාධක පනවන ලෙස ලෝක ප්‍රජාවගෙන් ඉල්ලා සිටියේය. මියන්මාර හමුදාව පසුගිය පෙබරවාරි 01වනදා දේශපාලන නායකයින් හා ක්‍රියාධරයින් සිරභාරයට ගනිමින් හමුදා කුමන්ත්‍රණයක් දියත් කරන ලදී. එතැන් සිට ගතවූ මාස 06ක කාලයේදී විරෝධතාවල යෙදුණ විරෝධතාකරුවන් 900ක් පමණ ඝාතනය කර ඇති අතර 10,000කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගනු ලැබ තිබේ.

## ඊශ්‍රායලය: නායකයින්ගේ ඔත්තු බැලීමේ මෘදුකාංගයක් කුලියට දී




ඊශ්‍රායල රහස් පරීක්ෂක සමාගමක් වන NSO සමාගම විසින් නිපදවන ලද Pegasus නමැති මෘදුකාංගය ලෝකයේ රටවල ප්‍රධාන පෙළේ නායකයින්ගේ තොරතුරු සෙවීම සඳහා භාවිතා කර ඇති බව ජූලි  මස මුලදී හෙළිදරව් විය. මෙම මෘදුකාංගය ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මැක්රෝන් ඇතුළු නායකයින්ගේද ප්‍රංශ වාර්තාකරුවන් ගණනාවකගේද තොරතුරු සොයා බැලීම සඳහා මොරොක්කෝ රහස් ඔත්තු සේවාවන් විසින් භාවිතා කර ඇති බවට වාර්තා පළ විය.

# අර්බුදයේ මාළු බෑම!

## කළු සල්ලි සුදු කරන ස්වෙච්ඡා හෙළිදරව් පනත



වත්මන් ගෝඨාභය රාජපක්ෂ මූලික රාජපක්ෂ පවුල් ආණ්ඩුව ආණ්ඩුකරණයේදී සෑම අංශයකින්ම අසාර්ථකත්වයට පත්ව ඇති බව රට පුරා පැතිරී යන ජනතා විරෝධතා රැල්ලෙන් මනාව පෙනී යයි. ආණ්ඩුවම පොහොර තහනමක් පනවා සියලු ආකාරයේ ගොවිතැන්වල නියුතු ගොවීන් මහපාරට කැඳවා ගත්තේය. ආනයන තහනම් ගැසට් මගින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයින්, කර්මාන්තකරුවන් ආණ්ඩු විරෝධයේ කොටස්කරුවන් කර ගත්තේය. කොරෝනා අස්සේම හොර රහසේ පෝට් සිටි පනත සම්මත කළා සේ, අධ්‍යාපන මිලිටරීකරණය කිරීමේ වුවමනාවට ගෙන ආ කොතලාවල පනත අද ආණ්ඩුවට තවත් දැවැන්ත විරෝධතා රැල්ලක්ම නිර්මාණය කළ පාරාවළල්ලක් වී ඇත. වෙනදා මහපාරට පැමිණියේ ශිෂ්‍යයන් පමණය. අද විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සිට දෙමාපියන්, ගුරුවරුන්, ශිෂ්‍යයන් දක්වා අධ්‍යාපනයට සම්බන්ධ සියලු කණ්ඩායම් සටනට කැඳවා ඇත්තේය.

මේ සියලු මහජන විරෝධයන්ගේ මූලය වී ඇත්තේ ධනපති ආණ්ඩුව මුහුණදෙන දැවැන්ත ආර්ථික අර්බුදයයි. එහි ප්‍රධාන කොටස වී ඇත්තේ දේශීය හා විදේශීය ණය අර්බුදය බව අපි මීට කලින්ද අවස්ථා කිහිපයකදී සාකච්ඡා කර ඇත්තෙමු. ආණ්ඩුවේ මේ ආර්ථික අර්බුදය කොරෝනා වසංගතයේ ප්‍රතිඵලයක් නොවේ. කොරෝනා විසින් සිදු කළේ අර්බුදයේ ස්වභාවය නිසි පරිදි හෙළිදරව් කිරීමයි. ආණ්ඩුවේ පුරාජේරු, කයිවාරු, හිස් වචන පමණක් බව ජනතාවට ඔප්පු කිරීමයි.

ධනපති පාලනයේ මුග්ධ ස්වභාවය වන්නේ අර්බුදයෙන්ද වාසි ලැබිය හැකි නම් ඒ සඳහා ජනතාව මුලාකිරීමට උපක්‍රම යෙදීමය. "රාජපක්ෂ පවුල් සමාගම" පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති, හෙළිදරව් කර නොමැති ආදායම්, වත්කම්වලට බදු සමාවක් ලබාදීමේ මුදල් පනත් කෙටුම්පතද එවැනි බොරදියේ මාළු බෑමට දරන ලද උත්සාහයකි.

### නීති අනීතික කිරීම

රටක පාර්ලිමේන්තුව නීති පැනවිය යුත්තේ සුළු පිරිසක් සතුටු කිරීමට නොව පොදු මහජනතාවගේ උන්නතිය උදෙසාය. එය බහුතර ජනතාවට යහපත විය යුතුය. නමුත් ආණ්ඩුව මේ ගෙනැවත් ඇත්තේ පවතින නීති යටතේ හෙළිදරව් කළ යුතු පුද්ගලයින් විසින් හෙළි නොකළ වත්කම්, දේපළ, ආදායම් ඉපයීම්, ආණ්ඩුවට 01% ක පගාවක් ගෙවා හෙළිදරව් කිරීමට හැකියාවක් ලැබෙන මුදල් පනතකි. නීතිය නැමීමේ ආණ්ඩුවේ උත්සාහය තේරුම් ගැනීමට මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම තවත් කදිම අවස්ථාවකි.

මෙම මුදල් පනතින් ආණ්ඩුව සිදුකිරීමට උත්සාහ කර ඇත්තේ දැනට ආදායම් බදු පනත යටතේ, මුදල් විශුද්ධිකරණ පනත යටතේ සහ එකතු කළ අගය බදු පනත වැනි අණ පනත් මගින් හෙළිදරව් කළ යුතු ආදායම් හෙළිදරව් කිරීමට බැඳී ඇති පුද්ගලයින් ගෙවිය යුතු, නමුත් නොගෙවා පැහැර හැර ඇති, රජයට හිමිවිය යුතු ආදායම් නීතිය ක්‍රියාත්මක කර අයකර ගන්නවා වෙනුවට එම පැහැර හැරීම සිදු කළ පුද්ගලයින්ට එම මුදල්, වත්කම් වටිනාකමින් ආණ්ඩුවට 01%ක් ගෙවා පිරිසිදු මුදල් වත්කම් බවට පත් කර ගැනීමට ඉඩ සැලැස්වීමයි.

එයින්, මෙතෙක් සාධාරණ ලෙස එම බදු ගෙවූ පුද්ගලයින්ට අසාධාරණයක් වනවා පමණක් නොව බදු නොගෙවා පැහැර හැර තිබූ පුද්ගලයින්ට විශේෂ වරප්‍රසාදයක් ලෙස තමන් ඉපැයූ ආකාරය හෙළිදරව් නොකර එම මුදල් විදේශයක සඟවා ඇත්නම් ඒවා රට තුළට ගෙන ඒමටත්, ලංකාවේ එම මුදල් ආයෝජනයටත් පහසුකම් සලසා දී ඇත.

### කළු සල්ලි කා ළඟද?

ලංකාවේ වගාවට පොහොර නැති ගොවියන් විසින් රටේ පවතින නීතිය යටතේ හෙළිදරව් කිරීමට නොහැකි මුදල් වී බිස්සේ සඟවා ගෙන නැත. මාසයකට රුපියල් 33,000ක් පමණ වැටුප් ලබන ගුරුවරුන්ද තම ඉපයීම් සඟවා නැත. ලීසිං වාරික ගෙවා ගත නොහැකිව ලතවෙන බස්රථ, ත්‍රීරෝද රථ හිමියන්ටද නැත. බැංකුවට දේපළ සින්න වීමට අනතුර අතේ තබාගෙන ව්‍යාපාර කරන සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයින්ටද හෙළිදරව් කිරීමට නොහැකි ධනයක් ඉතිරිව ඇත්තේ නැත.

එසේ නම්, මේ ආර්ථික අර්බුදය අස්සේ ආණ්ඩුව විසඳුමක් සොයන්නේ කා වෙනුවෙන්ද? මෙය ආර්ථික අර්බුදයට විසඳුමක්ද? නැතහොත් රටටත්, ජනතාවටත් වංචා කළ හොරු රැළකගේ ගැටලුවකට විසඳුම් සෙවීමක්ද?

1994න් පසු මේ රට වැඩිම වසර ගණනක් පාලනය කළ පාලනයන්ට, රාජපක්ෂවරුන් අයත්ය. 1994ට පෙර එ.ජා.ප. පාලනය තුළ ඇමති ධුර දැරූ, මහවැලි ව්‍යාපාරයේ සිටම දූෂණයට නම් දැරූ පුද්ගලයින්, දේශපාලකයෝ එ.ජා.ප. පාලනයන් තුළත් මේ හැම ආණ්ඩුවකමත් කලවම් වී සිටිති. ඔවුන් දේශපාලන බලය, ඇමති බලතල යොදා ගනිමින් උපයන ලද ධනයේ වැඩිම පංගුව ඇත්තේ රටේ නීත්‍යානුකූලව ඉපැයූ ධනය ලෙස හෙළිදරව් කර නොවේ. එම ධනය ඒකරාශී කර ඇත්තේ කළු සල්ලි ලෙසටය. උපයා ඇත්තේ ටෙන්ඩර ගනුදෙනුවලට උදව් කිරීමෙනි; කොමිස් මුදල් මගිනි. ඒ නිසා ආණ්ඩුකරණයේ මුවාවෙන් උපයන ලද මුදල්, සාධාරණ ලෙස ඉපයූ බවට ඔප්පු කළ නොහැකි බොහෝ දෙනෙකු එම මුදල් තැන්පත් කර ඇත්තේ විදේශ බැංකුවලය. නැතිනම් සමහර අප්‍රසිද්ධ දූපත් රාජ්‍යයන් තුළය. පැනමා ගිණුම් පිළිබඳව ශ්‍රී ලංකාවේ දේශපාලකයින්ගේ නම්ද පසුගිය කාලයේ සාකච්ඡා විය.

මේ ලංකාවේ මේ මොහොතේ ආර්ථිකය බංකොලොත් වී ඇති නිසා හොර සල්ලි වුවද ලැබෙන්නේ නම් හොඳය යන මතයට අනුව කටයුතු කරමින්, බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිවරයා ලෙස පත්වී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පළමු මුදල් පනතට පදනම හදා ගත්තේය. නමුත් ඒ රටේ ජනතාවට ප්‍රතිලාභ වෙනුවෙන් නොව ආණ්ඩුවේම රාජපක්ෂ කඩයේ සහ ගජ මිත්‍රයන්ගේ කළු සල්ලි සුදු කිරීම වෙනුවෙනි.

2003 දී රවී කරුණානායක මුදල් ඇමති ලෙස කටයුතු කරමින් මෙවැනිම දූෂිත මුදල් සෝදා පිරිසිදු කිරීමේ බදු සමා පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එවකට ජනාධිපති චන්ද්‍රිකා සහ රනිල් වික්‍රමසිංහ පාලනය අතර පැවැති තදබල ප්‍රතිවිරෝධී බල සට්ටනය නිසා එම පනත ක්‍රියාවට නැගීමට නොහැකි විය. එදා එම පනත ඉදිරිපත් කරන මොහොතේදී ඊට විරුද්ධව අදහස් පළ කළ (එදා පොදුජන එක්සත් පෙරමුණ) අය, අද මෙම පනත ගෙන එන ආණ්ඩුව නියෝජනය කිරීමද ධනපති වුවමනාවන් පක්ෂවලට බෙදුනද එකම අරමුණකින් ක්‍රියාවට නගන බවට හොඳ නිදසුනකි.

> ධනපති පාලනයේ මුග්ධ ස්වභාවය වන්නේ අර්බුදයෙන්ද වාසි ලැබිය හැකි නම් ඒ සඳහා ජනතාව මුලාකිරීමට උපක්‍රම යෙදීමය. "රාජපක්ෂ පවුල් සමාගම" පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති, හෙළිදරව් කර නොමැති ආදායම්, වත්කම්වලට බදු සමාවක් ලබාදීමේ මුදල් පනත් කෙටුම්පතද එවැනි බොරදියේ මාළු බෑමට දරන ලද උත්සාහයකි.

### පගා බද්ද

මෙම පනත යටතේ ආණ්ඩුවට 01%ක වටිනාකමක් ගෙවීමෙන් අදාළ සියලුම කළු සල්ලි සුදු කර ගැනීමේ වරප්‍රසාදය මේ පනතේ ප්‍රතිලාභීන්ට ලැබෙනු ඇත. එම මුදල් 2021 දෙසැම්බර් 31ට පෙර ලංකාවේ ආයෝජනය කළ යුතු වේ. ඒ සඳහා මාර්ග කිහිපයක් ආණ්ඩුව විවෘත කරයි. එනම්, ලංකාවේ කොටස් වෙළඳපොළේ කොටස් මිලදී ගන්නට මෙම මුදල් යෙදවිය හැකිය. රජය වෙනුවෙන් මහ බැංකුව නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත්වල හෝ භාණ්ඩාගාර බැඳුම්කරවල මෙම මුදල් යෙදවිය හැකිය. නැතිනම් නිල ලැයිස්තුගත ණය සුරැකුම්වලට යෙදිය හැකිය. එසේම, ශ්‍රී ලංකාවේ චංචල හෝ නිශ්චල දේපළ මිලදී ගත හැකිය.

මේ ඉහත ආකාරවල යෙදවිය නොහැකි නම්, එම හෙළිදරව් කරන මුදල් දෙසැම්බර් 31ට පෙර බැංකු ගිණුමක තැන්පත් කළ යුතුය. නමුත්, එම මුදල් තැන්පත් කළ පසු නැවත ලබාගත හැකි වන්නේ කවදාටදැයි සීමාවක් යොදා නොමැත. ඒ අනුව කළු සල්ලි සුදු කිරීමේ වුවමනාව ඇති අයෙකුට එම මුදල් 01% ක් ආණ්ඩුවට ගෙවා පසු දිනම වුවත් යළි ඉවත් කර ගැනීමේ හැකියාවක් මෙම පනතින් සකස් කර දී ඇත.

### සුදු සල්ලි යෙදවීම

ආණ්ඩුවට මේ ආකාරයට සුදු කර ගන්නා මුදල් යෙදවීමට අදාළ ආයෝජන අවස්ථාද මේ දිනවලම විවෘත කරමින් පවතී. පෝට් සිටි පනත හරහා විවෘත කරන ලද්දේ එක් දොරටුවකි. හෙළිකරන මූලාශ්‍රයක් නොමැති නිසාත්, මෙම අනාවරණය කරන මුදල් පිළිබඳව තොරතුරු දැනගැනීමේ පනත යටතේවත් සාමාන්‍ය ජනතාවට දැන ගැනීමට ඉඩක් නොලැබෙන නිසාත්, විනාශයට පත්වන ආර්ථිකයේ ඉතිරි වී ඇති සම්පත් කොටසත් ජාත්‍යන්තර මිතුරන්ට විකිණීමටත්, ඉතිරි ප්‍රමාණය මෙතෙක් ලෝකයේ රටවල සඟවන ලද මුදල් ලංකාවට රැගෙන විත් තමන්ට නතුකර ගැනීමටත් ධනපති කැදර පාලකයෝ මෙවැනි උපක්‍රම සකස් කර ගනිමින් සිටිති.

මෙවැනි අර්බුද අවස්ථාවන් සහ ජනතාවගේ පොදු යහපත වෙනුවට අතිශය ආත්මාර්ථකාමී ලෙස බලය හා ධනය වෙනුවෙන් යොදා ගන්නා මෙම පාලක කල්ලි පරාජය කරන තුරුම ජනතාවට මෙවැනි අත්දැකීම් විඳීම හැර වෙනත් පිළිතුරක් නොවනු ඇත. ඒ නිසා විසඳුම ඇත්තේ ඔබ අප අතමය.



"මා පමණක් නොව සමස්ත ලෝකයම දන්නා පරිදි ධනවාදී ක්‍රමය ඇමරිකා එක්සත් ජනපදය හෝ ලෝකය යන දෙකින් කිසිවකට සේවය නොකරයි. ඒ වෙනුවට එවා සෑම කල්හිම කලිනට වඩා බරපතළ ලෙස අර්බුදයෙන් අර්බුදයට තල්ලු කරවයි."

**ෆිදෙල් කස්ත්‍රෝ**
**හවානා සරසවි දේශනයකදී 2010**

# නීත්‍යානුකූල නොවන ආකාරයට කිසිවෙක් අත්අඩංගුවට ගන්න බැහැ



නීතීඥ ශානිකා හංසනී මෙනවිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) උප ව්‍යවස්ථාව අනුව සෑම පුරවැසියෙකුටම තම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියක් තියෙනව ඒ යටතේ ආණ්ඩුව මෙන්ම රාජ්‍ය නිලධාරින් විවේචනය කිරීමට පවා පුරවැසියන්ට පුළුවන් ඒ වගේම 14(1)(ආ) උප ව්‍යවස්ථාව අනුව සාමකාමී රැස්වීමේ මූලික අයිතියක්ද පුරවැසියන්ට තියෙනවා. එහෙත් පසුගිය සති කිහිපය තුළ ආණ්ඩුව විසින් නිරෝධායන නීති යටතේ බව පවසමින් නීති විරෝධී ලෙස එම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළා. මූලික අයිතිවාසිකමක් සීමා කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාවේ සඳහන් හේතූන් මත පාර්ලිමේන්තුව විසින් සම්මත කරගනු ලබන නීතියක් මඟින් පමණක් යන්න මෙහිදී ආණ්ඩුව නොසලකා හැර තියෙනවා.

මෙහිදී පොලිසිය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උක්ත ව්‍යවස්ථාවන්ට පමණක් නොවෙයි 11 වන ව්‍යවස්ථාවේ සඳහන් කිසිදු පුද්ගලයෙකු ක්‍රෑර හෝ අවමන් සහගත සැලකීමකට හෝ දඬුවමකට යටත් නොකළ යුතුය යන්න පවා උල්ලංඝනය කරනු ලැබුවේ බලහත්කාරයෙන් අත්අඩංගුවට ගත් කාන්තාවන්ගේ ඇඳුම් පවා ඉරා දමමින්, පහර දෙමින් සහ ඔවුන් රැගෙන ගිය ආකාරයෙන් එය කාන්තාවන්ට විතරක් නොවෙයි අත්අඩංගුවට පත් සියලු විරෝධතාකරුවන්ට අදාළයි. එ වගේම 13(1) උප ව්‍යවස්ථාවට අනුව නීත්‍යානුකූල නොවන ආකාරයට කිසිවෙක් අත්අඩංගුවට ගන්න බැහැ.

නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගත් පිරිසට ඇප ලබාදීමෙන් පසු බලහත්කාරයෙන් නිරෝධායනයට යොමු කිරීමත් මුළුමනින්ම නීතිවිරෝධීයි. ඒ වගේම 1994 වසරේ ශ්‍රී ලංකාව විසින් පාර්ශවකරුවෙකු ලෙස අත්සන් තබන ලද එක්සත් ජාතින්ගේ වධහිංසාවට එරෙහි සම්මුතිය මෙරට බලාත්මක කරමින් සම්මත කරගන්නා ලද 1994 අංක 22 දරණ වධහිංසාවට එරෙහි සම්මුති පනතේ ප්‍රතිපාදනයන් උල්ලංඝනය කිරීමක්ද වෙනවා.

මෙම පොදු නීතිමය කරුණුවලට අමතරව කාන්තාවන් බලහත්කාරයෙන් අත්අඩංගුවට ගැනීමේදී පොලිසිය විසින් උල්ලංඝනය කරපු නීතිමය ප්‍රතිපාදනයන් කිහිපයක් තියෙනවා. මේ අත්අඩංගුවට ගැනීම් සිදුවූ ඇතැම් අවස්ථාවල කාන්තාවන් බලහත්කාරයෙන් රැගෙන යනු ලැබුවේ පොලිස් නිලධාරින් විසින්. කොතලාවල පනත් කෙටුම්පතට එරෙහිව පාර්ලිමේන්තු වටරවුම ඉරිදිපිට පැවති විරෝධතාවයේදී නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගත් කාන්තාවන් මුලතිව් නිරෝධායන කඳවුරේ නිලධාරිනියක් නොමැතිව රඳවා ගත්ත ඒක පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝගවල සඳහන් කාන්තාවක් අත්අඩංගුවට ගැනීමේදී සහ රඳවා තබා ගැනීමේදී පොලිස් නිලධාරිනියක් සිටිය යුතුය යන්න උල්ලංඝනය කිරීමක්. ඒ වගේම ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති ස්ත්‍රීන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය උල්ලංඝනය කිරීමක්ද වෙනවා.

# මර්දනය හමුවේ කාන්තා වගකීම

ලොව පිළිගත් සම්ප්‍රදායක් වන්නේ අන් සැමටම වඩා ළමුන්ට සහ කාන්තාවන්ට විශේෂ සැලකිල්ලක් දැක්වීමයි. ශ්‍රී ලංකාවේද අතීතයේ පටන් පැවති මෙවැනි සම්ප්‍රදායන් ගැන අපට අදහසක් තිබේ.

නමුත් වර්තමානයේ ලංකාවේ කාන්තාවන්ට ඇත්තේ අමුතුම සැලකිල්ලකි. සමාජයේ සෑම ක්ෂේත්‍රයකම කාන්තාවන් පීඩාවට පත්වෙන
අයුරු අප දැක තිබුණි. එවැනි හිංසනයන්ට එරෙහිව කාන්තාවන් පිහිට පැතුවේ පොලිසියෙනි. ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශයක් පිහිටුවා ඇත්තේ මේ පීඩාවට පත්වෙන කාන්තාවන් හා ළමයින් වෙනුවෙනි.

එහෙත් සරණක් වේයැයි සිතූ පොලීසියම අද කාන්තාවන් හිංසනයට ලක් කරන ආකාරය පසුගියදා අපි දුටුවෙමු. බඩු මිල ඉහළ යාමට, තෙල් මිල ඉහළ දැමීමට, පොහොර ප්‍රශ්නයට, කොතලාවල පනත හරහා අධ්‍යාපනය පෞද්ගලීකරණයට එරෙහිව වීදිබට ජනතාව අතර කරට කර කාන්තාවන්ද අරගල බිමේ හිඳිනු දක්නට ලැබුණි. ඒ අරගල කළ මව්වරුන්ට, සොයුරියන්ට ආණ්ඩුවේ පොලිසිය විසින් සැලකූ ආකාරය නින්දා සහගතය. මව්වරුන්, සොයුරියන්, බිරින්දෑවරුන් නැති පුද්ගලයන් සේ පොලිස් නිලධාරීන් කාන්තාවන්ට හිංසා කළ අයුරු හෙළා දැකිය යුතුය. අනෙක් පැත්තෙන් පොලිස් නිලධාරිනියන්ගේ හැසිරීමද නිලධාරීන්ට දෙවෙනි වූයේ නැත.

"සාමාන්‍යයෙන් පිළිගත් කරුණක් වන්නේ කාන්තාවන් අත්අඩංගුවට ගැනීමේදී හෝ පරීක්ෂා කිරීමේදී එය කළ යුත්තේ පොලිස් නිලධාරිනියන් විසින් බවයි. නමුත් පසුගිය සිදුවීම් දෙස බැලීමේදී නිලධාරිනියන් වෙනුවට පොලිස් නිලධාරීන් විසින් කාන්තාවන් අත්අඩංගුවට ගන්නා අයුරු දැක ගත හැකි විය. මව්වරුන් අත්, කකුල්වලින් ඇදගෙන උස්සාගෙන යන අයුරුත්, සහෝදරියන් බිම දිගේ ඇදගෙන යන අයුරුත් අපි දුටුවෙමු. ඒ පමණක් නොව උසාවි භූමියේදී පවා එක් පොලිස් නිලධාරියෙකු විසින් අත්අඩංගුවට ගත් සහෝදරියකට පා




පහරක් එල්ල කරන ආකාරය මාධ්‍ය විසින් අනාවරණය කෙරුණි.

එසේ කාන්තාවන් ශාරීරික හිංසනයට ලක්වෙන අතර තවත් විටෙක ලිංගික හිංසනයකටද ගොදුරුවන අයුරු දක්නට ලැබුණි. පසුගියදා පැවති උද්ඝෝෂණ මර්දනයේදී ඇති වූ නොසන්සුන්කාරී තත්වයන් හමුවේ, එයට සහභාගි වූ එකදු පිරිමි පුද්ගලයෙකුගේ ඇඳුම් ඉරී ගොස් නොතිබුණි. නමුත් කාන්තාවන් කිහිප දෙනෙකුගේම ඇඳුම් ඉරී ගොස් තිබුණේ කුමක් නිසා දැයි ගැටලුවක් පැන නගී. ආණ්ඩුවේ අණ පිළිපදින නිර්ලජ්ජී පොලිසියේ ඇතමුන් තම පහත් මානසිකත්වය පෙන්නුම් කළා දැයි අපට සැකයක් ඇති වන්නේ පිරිමි කිසි කෙනෙකුගේ ඇඳුම් ඉරී නොතිබුණ හෙයිනි.

ආණ්ඩුව කොවිඩ් වසංගතයට වසන් වී ජනතාව වෙත මර්දනය මුදා හරිමින් තිබේ. ඒ සඳහා තම පැවැත්ම වෙනුවෙන් තනා ගත් ධනපති නීති පද්ධතියද අභියෝගයට ලක් කරමින් ඔවුන් කටයුතු කරමින් සිටී. එනම් පොලිසිය අනීතිකව කටයුතු කරන අතර පාලකයා පොලිසියේ අනීතික කටයුතු නීත්‍යානුකූල බව රටට හඟවන්නට උත්සාහ කරමින් හිඳියි.

එසේම මවට, දියණියට, බිරිඳට ගරුත්වයෙන් සැලකූ සංස්කෘතියක් තිබුවා යැයි කියූ රටක, බෞද්ධ ආගම පිළිබඳ මහා ඉහළින් කතා කරන, ඒ තුළ කාන්තාවන් පිළිබඳ අපමණ අගය කිරීම් සහිත වූ රටක වර්තමානයේ සෑම පැත්තකින්ම කාන්තාවන් පෙළා දමන තත්වයද අප දේශපාලනිකව කියවා ගත යුතුය.

කෙසේ වෙතත් පාලකයා එක් කරුණක් අවබෝධ කරගත යුතුය. කාන්තාවන්ට හිරිහැර කිරීමෙන් හෝ ලිංගික හිංසනයට ලක් කිරීමෙන් හෝ ඔවුන් නැවැත්විය නොහැකි බව මෙන්ම ලෝකය වෙනස් කළ බොහෝ අරගලවල කාන්තාවන්ද ඉදිරියෙන්ම සිටි බවය.

## එක්ව හඬ නගමු

ගිගුම් දෙන දනන් මහ මඟ
රිදුම් දෙන හදුන් තැන තැන
යදම් බිඳ දමනු රිසියෙන්
ඇවිත් එක ලෙසින්

ලබාගෙන සියලු පුද පෙත්
අහක බැලු නමුත් දෙවියන්
දෙවොල් නැති සැබෑ දෙවිවරු
වීදි බැස සැණෙන්

පලාගෙන නොවේ එක කුස
දරාගෙන එකම අරමුණ
එකාවන් ලෙසින් හඬගා
කියමු එක හඬින්

සසිරි බර මගේ මව් රට
අසිරි මිල නොකර නොරටට
හුස්ම පොද පවා රකිනට
සපථ වෙමු බැතින්



# කොලොම්බියාවේ කාන්තාවන්ට එරෙහි හිංසනය



පසුගිය මාස දෙකක පමණ කාලයක සිට කොලොම්බියාවේ ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ රැල්ලක් ආරම්භ වී තිබේ. මෙලෙස උද්ඝෝෂණවල නිරත වෙන කාන්තාවන්ට පොලිස් නිලධාරීන් විසින් නොමනා අපහාස, තර්ජන, මානසික හිංසන එල්ල වන බවට අරගල වල යෙදෙන කාන්තාවන් චෝදනා කරති. දූෂණයට ලක්කරන බවට පවා තර්ජනය කරමින් උද්ඝෝෂණයන්හි නිරත වන කාන්තාවන් බියපත් කරවීමට පොලිසියේ ඇතැම්හු ක්‍රියා කරමින් සිටිති. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන කාන්තා ක්‍රියාකාරිනියන් පෙන්වා දෙන්නේ බොහෝ කාන්තාවන් මෙවැනි තර්ජනයන්ගෙන් නොසැලී වැදගත් භූමිකාවක් අරගල තුළ ඉටුකරමින් සිටින බවයි.

# LGBTQI+ ප්‍රජාවට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය



තුර්කියේ ප්‍රාදේශීය අධිකාරීන් මෙම වසරේදීත් LGBTQI+ අභිමානයේ පාගමන තහනම් කරන ලදී. මෙය තහනම් කරනු ලැබුවේ ප්‍රචණ්ඩත්වය, ත්‍රස්තවාදය, මහජන සාමය, සෞඛ්‍යය හා සදාචාරය කඩවීම වැනි පදනම් විරහිත හේතු කීහිපයක් දක්වමිනි. ජූනි 26 වැනි දින මෙම පාගමනේ ආරම්භක ස්ථානයට පැමිණි කැරලි මර්දන පොලිසිය ඒකරාශී වූ පිරිසට ප්ලාස්ටික් උණ්ඩ හා කඳුළු ගෑස් ප්‍රහාරයක් ද එල්ල කළ අතර මාධ්‍යවේදීන් ඇතුළු 20කට ආසන්න පිරිසක් අත්අඩංගුවට ගැනීමටද කටයුතු කරන ලදී. 2015 වර්ෂයේ සිට මෙම පාගමන තුර්කි බලධාරීන් විසින් තහනම් කොට තිබේ. මෙවර අභිමානයේ පාගමන සංවිධානය කිරීමේ එක් අරමුණක් වූයේ තුර්කිය ඉස්තාන්බුල් සම්මුතියෙන් ඉවත්වීමට විරෝධය පළකිරීමයි. ජූලි 01 වන දා තුර්කියේ කාන්තාවන් දැවැන්ත විරෝධතා සංවිධානය කර තිබුනේද එම අරමුණ වෙනුවෙනි.

## සිව්දෙසින්

# අපහාසයට එරෙහිව පාකිස්ථාන කාන්තාවන් පාරට



කාන්තාවන් විනීතව හා සංවරව අඳින්නේ නම් ලිංගික ප්‍රචණ්ඩක්‍රියා අඩුවනු ඇති බවට පාකිස්තාන අගමැතිවරයාගේ ප්‍රකාශයකට එරෙහිව සහ ඔහු එම ප්‍රකාශය සම්බන්ධයෙන් මහජනයාගෙන් සමාව ඇයදිය යුතු බවට එරට විරෝධතා රැල්ලක් ඇතිවිය.

ඔහු සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කර ඇත්තේ කාන්තාවන් අඩුවෙන් ඇඳුම් අඳින විට එය පිරිමින් මත බලපාන බවත් පිරිමින් රොබෝවරුන් නොවන බවත්ය. ඔහුගේ මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් එරට කාන්තාවන්ගෙන් දැඩි විරෝධයක් එල්ල වූ අතර උද්ඝෝෂණද සංවිධානය වී තිබුණි.

# ළමා හිංසන බේදවාචකයේ සමාජ ආර්ථික සාධක

ප්‍රසුගියදා රිෂාඩ් බදියුදීන් මහතාගේ නිවසේ මෙහෙකාරකමට සිටි 16 හැවිරිදි ගැහැනු දරුවෙක් හිංසනයට ලක්ව මිය යාමත් සමග ළමා හිංසනය, අතවර කිරීම, ළමා මෙහෙකාර සේවය පිළිබඳ තියුණු කථා බහක් අපේ සමාජයේ ඇතිවී තිබේ. මෙවැනි හිංසනවලදී ඊට එරෙහිව සමාජයක් ලෙස නැගී සිටීම, ඒ වෙනුවෙන් සංවේදීවීම ශිෂ්ට සමාජයක හොඳ ලක්ෂණයකි. මීට පෙරද මෙවැනි අවස්ථාවල එකී අදාළ සිදුවීමට සමාජය කම්පනය වී ප්‍රතිචාර දක්වන අවස්ථා අප දැක ඇත. මීට වසර කීපයකට පෙර මැද පෙරදිග රටකදී රිසානා නම් දැරිය හිස ගසා මරා දැමූ විටද සමාජය කම්පනය විය. එහෙත් කණගාටුවට කරුණ වන්නේ එම සිදුවීම් ක්‍රමානුකූලව අතීතයට එක්වන විට විරෝධයන් හා සංවේදීකම්ද මැකීයාමය.



"මිනිසා මාලිගාවකදී හා පැල්පතකදී වෙනස් ආකාරයට සිතයි. සාගින්න නිසා, දුක්ඛිත තත්වය නිසා ඔබට සිරුර තුළ පෝෂණය සඳහා දෙයක් නොමැතිනම්, ඒ ආකාරයෙන්ම ඔබේ ඔළුවේ, ඔබේ මනසේ සහ හදවතේ සදාචාරය පෝෂණය සඳහා දෙයක් නොමැත"

**ලුද්විග් ෆෙයාබාහ්ග්**
**(ජර්මානු දාර්ශනිකයෙකි)**

### සමාජ වගකීම හඳුනා ගැනීම

ශිෂ්ට සම්පන්න හා සවිඥානික සමාජයක සැබෑ වගකීම වන්නේ කුමක්ද? යම් සිදුවීමක් සිදුවූ විට එයට එරෙහිව හඬනගා පසුව එම තත්වය අමතක කර දැමීමද? නැත. එසේ වුවහොත් සමාජයට හැම විටම සිදුවීම්වලට ප්‍රතිචාර දක්වමින් පමණක් සිටීමට සිදුවනු ඇත. සංවේදී ශිෂ්ට සම්පන්න සමාජයක මිනිසුන්ගේ හා ගැහැනුන්ගේ සැබෑ වගකීම වන්නේ සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීම පමණක් හෝ සිදුවීමට අදාළ චූදිතයාට නීතිය ක්‍රියාත්මක කරවා 'දැන් හරි' යැයි සැනසුම් සුසුම් හෙළීම නොව මෙවැනි ඛේදජනක සිදුවීම් නිර්මාණය වීම වැළැක්වීමට මැදිහත් වීමය.

ස්ත්‍රී දූෂකයන්ට එරෙහිව, ළමා අපචාරවලට එරෙහිව වීදි බසින, අපරාධකරුවන් පෝරකයට යැවීමට බලකරන, ළමා මෙහෙකාරකම හෙළා දකින, ළමා හිංසනය ඉදිරියේ හදවත උණුවී කඳුළු සලන සමාජයම, දැනුවත්ව හෝ නොදැනුවත්ව එකී අපරාධ නිර්මාණය වන, අපරාධකරුවන් නිර්මාණය කරන හා රකින සමාජ ආර්ථික ක්‍රමයක් පවත්වාගෙන යාමටද දායක වෙමින් සිටින්නේ නම් එය කෙතරම් බිහිසුණුද? අප පිළිගැනීමට අකමැති වුවද මේ තනි තනි සිදුවීම්වලදී සංවේදී වන, හඬා වැලපෙන, කෝපයට පත්වන බොහෝ දෙනා සැබෑ ලෙසම අපරාධකරුවන් බිහි කරන හා රකින සමාජ ක්‍රමයක් පවත්වාගෙන යාමට දායක වෙමින් සිටිති. ඒ නිසා පොදු අර්ථයෙන් ගත් විට මේ අපරාධවල කිසියම් වගකීමක් සමාජයටද පැවරේ යයි අපි සිතමු. එබැවින් මෙවැනි දුක්බර සිදුවීම්වලදී සංවේදී වන සියලු දෙනා මෙම අපරාධ හා අපරාධකරුවන් නිර්මාණය වන සැබෑ හේතුද වටහා ගැනීම වැදගත්ය. ඒ එකී හේතු වෙනස් කිරීම සඳහාය.



### අපරාධ මනෝ විද්‍යාවෙන් එහා

ස්ත්‍රී දූෂකයෙකුගේ, ළමා හිංසකයෙකුගේ, එකී හිංසාකාරී අපරාධමය චින්තනය විස්තර කිරීමට සමාජ මනෝ විද්‍යාව, අපරාධ මනෝ විද්‍යාව වැනි විද්‍යාවන්ටද පුළුවන. අපරාධකරුවෙකුගේ මනස හැඩගැසෙන ආකාරය එවැන්නෙක්ගේ චින්තනය වැඩ කරන ආකාරය එකී අපරාධමය චින්තනයට අදාළ මොළයේ රසායනික ක්‍රියාකාරිත්වයන් ආදිය ඉන් විග්‍රහ කළ හැක. එසේම එවැනි අය ඇසුරු කරන සමාජ පරිසරය හා ඔවුන්ගේ ජීවන පෞරුෂයන් ගොඩනැගීමේදී එවැනි අය කුඩා කල සිට අත්විඳ ඇති සමහර අත්දැකීම් පිළිබඳවද විස්තර කළ හැක. එහෙත් මෙකී අපරාධ, අපරාධවලට ගොදුරුවන අය හා අපරාධවලට පෙළඹෙන අය දෙස බලන විට පුද්ගලයෙකුගේ මනස ක්‍රියාත්මක වන ආකාරය පවා තීරණය කරන සාමාජීයීය සාධකයන් කිහිපයක් අපට හඳුනා ගත හැක. අප වැඩි අවධානයක් යොමු කළ යුත්තේ ඒ වෙතය.

ලංකාවේ මෙන්ම ලොව බොහෝ රටවලට අපරාධවලට, හිංසනයට අතවර කිරීම්වලට ලක්වන ළමුන් දෙස, කාන්තාවන් දෙස බලන විට අපට හඳුනාගත හැකි එක් පොදු කරුණක් තිබේ. ඒ, මෙම අපරාධවලට ගොදුරු වන අයගෙන් සාතිශය බහුතරය, සමහරවිට සියයට සීයක්ම දිළිඳුකමට මුහුණ දුන් අය හා පවුලේ ආරක්ෂාව අහිමිව අනාරක්ෂිතභාවයට පත්වූ අය බවය. ඉතාම විශේෂ අවස්ථාවක හැර ස්ත්‍රී දූෂණවලට ලක්වන බොහෝ තරුණියෝ, කාන්තාවෝ දුප්පත් හා රැකවරණය (බලය) නැති අය වෙති. අතවරයට ලක්වන ළමුන්ද එසේය. ගෘහස්ථ හිංසනයට මෙහෙකාරකම්වලට ගොදුරු වන සියලුම දෙනා දුප්පත්කම හෝ පවුලේ ආරක්ෂාව නැතිවීම යන ව්‍යසනයන්ට මුහුණ දුන් අය වෙති. ඒ නිසාම මෙම අපරාධවලට ගොදුරු වන්නේ දුප්පත්කමට ගොදුරු වී ඇති, සමාජ ආරක්ෂාව හෝ පවුලේ ආරක්ෂාව නොමැති, 'බලයක්' නැති පවුල්වල අයය. මේ ප්‍රශ්නයේ සැබෑ හේතුව සොයා ගත යුත්තේ ඒ නිසාය.

### ධනවතුන් හා බලවතුන් අපරාධකරුවන් වන විට

අප ආරම්භයේම සඳහන් කළ සිදුවීමේ උදාහරණ සහිතවම ගත්කල අපරාධවලට හිංසනයට ගොදුරු වන්නන් දිළිඳු හා අසරණයින් වන විට අපරාධකරුවෝ පොහොසත් හා බලවත් අය වෙති. ලොව සියලුම පොහොසත්තු හා බලවත්තු අපරාධකරුවෝ නොවෙති. එහෙත් ලොව බොහෝ මේ වර්ගයේ අපරාධකරුවෝ එක්කෝ ධනවත්තුය; නැතිනම් බලවත්තුය. සත්‍යය එයයි.

දරුවන්, විශේෂයෙන් ගැහැනු දරුවන් මෙහෙකාරකමට දෙන දෙමාපියන් ඒ සඳහා පෙළඹෙන්නේ ඇයි? ඒ දරාගත නොහැකි දරිද්‍රතාවයත්, ආදායම් ලැබීමේ කිසිදු මාර්ග යක් නැතිකමත්, අසරණකමත් නිසාය. සමාජය තුළ පහළ පංතිය නියෝජනය වීම නිසා මානසිකව පීඩාවට පත්ව අසරණව සිටීම විසින් හදිසියේ අතට කීයක් හරි හොයා ගැනීම හා දරුවාගේ බරින් නිදහස් වීම වැනි සිතිවිලි පවා මේ සඳහා බලපාන බව පෙනේ. ඒ අතරම සමහර ධනවතුන්ට බලවතුන්ට කුමක් හෝ නිසා අවනත වීමට සිදුවීම විසිනුත් සමහරවිට අකැමැත්තෙන් පවා මෙවැනි තීරණ ගැනීමට දෙමාපියන් පෙළඹෙන බව පෙනේ. ඒ ප්‍රශ්නයේ එක් පැත්තකි.

අනෙක් පැත්තේ සිටිනුයේ එක්කෝ ධනවතුන්ය. නැතිනම් ධනය ඉපැයීම එකම අරමුණ කරගත් ඒ වෙනුවෙන් ඕනෑම දුෂ්ට වැඩක් කිරීමට සූදානම් අයය; එනම් බලවතුන්ය. මේ බලවත්තු එක්කෝ ධනයෙන් බලවත්ය; නැතිනම් දේශපාලන බලයෙන්, නිලධාරී බලයෙන් හෝ මැර බලයෙන් බලවත්ය. සැබෑ හිංසකයෝ වන්නේ ඔවුහුය.

වැඩිපුර ලාභ ලැබීම සඳහා තම ව්‍යාපාරවල රහසිගතව අඩු වැටුපට ළමා ශ්‍රමිකයින්ගෙන් වැඩ ගන්නා ව්‍යාපාර අයිතිකරුවෝ ලොව පුරා බොහෝ රටවල සිටිති. ළමා ආරක්ෂක නීති ඔවුනට අදාළ නැත. ඒ එක්කෝ ඔවුන් සතුව ධනය තිබීමය; නැතිනම් ඔවුන් බලවතුන් වීමය. ධනය හා බලය ඉදිරියේ නීතිය හීලෑ වෙන බව අපි හොඳින් දනිමු. ළමා හිංසනවලදී ස්ත්‍රී දූෂණ හෝ මෙහෙකාරියන්ට අතවර කිරීම්වලදී එය කරනු ලබන්නේ ධනවත් හෝ බලවත් අයයි. එයට ගොදුරු වන්නේ දුබලයෙක් වූ විට අපරාධකරුවා බිය නැත. ළමා හිංසනයේදී ධනවත් බලවත් ළමුන්ට හිංසා කිරීම් සිදු නොවන තරම්ය. ඊට හිංසකයින්ට අවස්ථාවන් නොලැබීම ඉන් ප්‍රධාන හේතුව වන අතර ඔවුන් ඊට බියවීමද සිදුවේ. ධනවත් හෝ බලවත් පවුලක ළමයෙක් කිසිවිටෙකත් මෙහෙකාරකමට විකිණෙන්නේ නැත. එබැවින් සමාජයේ පවත්වාගෙන යන පංති පරතරය, දිළිඳුකම, නූගත්කම (අධ්‍යාපනය ලැබීමට අවස්ථා නොලැබීම නිසා) අසරණකම මෙම අපරාධ හා ළමා හිංසනයන්ට සරු පසක් නිර්මාණය කර තිබෙන බව නොපෙනේද?

### සමාජ පරිවර්තනයක වුවමනාව

ළමා අපචාර පමණක් නොව කාන්තාවන්ට හා ළමුන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය තුළ පවා සමාජයේ පවතින හා ජීවිතය තුළ පවතින පීඩාව කාන්තාවන් හා ළමුන් වැනි දුර්වලයන් මතින් මුදාහැරීම නිසා සිදුවන බව හොඳින් බැලූ විට පෙනේ. සමහර දෙමාපියන් දරුවන්ට දරුණු ලෙස පහරදීම්, වධහිංසා කිරීම් තුළ පවතින්නේ එයයි. සමාජයේ පවතින ආර්ථික හා සමාජ පීඩාව පවුල තුළ පුපුරා ගිය විට එය සිදුවේ.

එසේම රැකියා ස්ථානවල, මඟතොටේ කාන්තාවන් මුහුණදෙන ලිංගික හිරිහැර දෙස බලන විටත් ඒවා සිදුකරන්නේ රැකියා ස්ථානයේ නම් පොදුවේ ඉහළ නිලධාරීන් තම බලය උපයෝගී කරගෙන බවත් මහමඟදී තම ජීවිතයේ අවශ්‍යතා ඉටුනොවුන විකෘති මනස් ඇති අයවලුන් අතින් බවත් පෙනේ. මේ නිසා ළමා අපචාර, ළමා හිංසන, ළමා මෙහෙකාර සේවය සැබෑ ලෙසම පිළිකෙව් කරන, ඒවා ස්ථිර ලෙසම වැළැක්විය යුතුයයි සිතන සියලු දෙනාගේ වගකීම වන්නේ සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීමෙන් සෑහීමකට පත් නොවී අපරාධකරුවන් නිර්මාණය කරන, වින්දිතයන්ද නිර්මාණය කරන මෙම වැරදි අසාධාරණ සමාජ ක්‍රමය වෙනස් කිරීමටද දායක වීමය. ධනය හා බලය මත පවතින සමාජයක් වෙනුවට ආර්ථිකයේදී මෙන්ම සමාජ ජීවිතයේද නීතිය තුළද සාධාරණය ඉටුවන සමාජයක් නිර්මාණය කිරීමට දායකවීමය. එසේ නොවන්නේ නම් මෙම හිංසනයන් හා අපරාධවලට හිතකර සමාජයක් පවත්වගෙන යාමේ වගකීමෙන් මිදීමට සමාජයට නොහැකි වනු ඇත.

**ළමා අපචාර, ළමා හිංසන, ළමා මෙහෙකාර සේවය සැබෑ ලෙසම පිළිකෙව් කරන, ඒවා ස්ථිර ලෙසම වැළැක්විය යුතුයයි සිතන සියලු දෙනාගේ වගකීම වන්නේ සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීමෙන් සෑහීමකට පත් නොවී අපරාධකරුවන් නිර්මාණය කරන, වින්දිතයන්ද නිර්මාණය කරන මෙම වැරදි අසාධාරණ සමාජ ක්‍රමය වෙනස් කිරීමටද දායක වීමය.**

# පොලිටිකල් පංතිය

ළමයි උදේම පංතියට ඇවිල්ල හිටියට පොලිටික්ක හුඟවෙලාවක් යනකම් ආවෙ නෑ. කොල්ලො කට්ටිය කඩදාසි බෝලෙකින් ටී ටුවෙන්ටි පටන් ගත්ත අතරෙ කෙල්ලො ටික කදේ දාගත්ත.

"අපි මෝඩයො  වගේ ඇවිත් ටැග් ගැහුණට සරුත් ස්ට්‍රයික්ද දන්නෙ නෑ" කනිය මංජුවට යෝකර් එකක් දාන ගමන් කිව්ව.

"නෑ වෙන්න බෑ. එයා ස්ට්‍රයික් එකට විරුද්ධයිනෙ" මංජුව කිවුවෙ පොතකින් හරවා පහරක් එල්ල කරන ගමන්.

"ඒ කියන්නෙ සරුත් හොරිකඩයෙක්" සමන් තනි වචනෙකට ගත්ත.

"ඊයා... කාටද ඔයාලා හොරිකඩයෙක් කිවුවෙ?" බාගෙට ඇහුණ අනුරුද්දියගෙ මූණ ඇඹුල් වෙලා.

"සර්ට... මේක මම හදල කිවුව නෙමෙයි. හොරිකඩ වැඩ කරනකොට... ඒ කියන්නෙ ස්ට්‍රයික් එකක් කඩාකප්පල් වෙන විදිහට වැඩ කරන අයට කියන්නෙ එහෙම තමා" සමන වැඩිදුර පැහැදිලි කළා.

"දැන් සර් මොකද්ද කරපු හොරිකඩ වැඩේ" වසන්තියත් සර් වෙනුවෙන්

"ඒකෙනෙ අපිටත් හොරෙන් එන්න කියල උගන්නන්නෙ. අපරාදෙ මට නිදා ගන්න තිබුණ වෙලාව" කනිය විස්සෝප වෙනව.

"ඒ වුණාට සර් උගන්නන්න හදන්නෙ අපිටනෙ. හොරිකඩයා එක වැරදියිනෙ" අනුරුද්දිය රීති ප්‍රශ්නයක් දැම්ම.

"අපිට උගන්නන්න හදන එක වෙන දෙයක්. දැන් ගුරුවරු වැටුප් සටනක ඉන්නකොට සර් විතරක් හොරෙන් උගන්නන එක හරිද?" මංජුව ප්‍රතිඋත්තර බැන්ද.

"සර් හොරිකඩයා වෙන්නෙ අපිට නෙමෙයි. අනෙක් ගුරුවරුන්ට. වැඩවර්ජන පාවා දෙන අයට ඉතිහාසෙ පුරා කිවුවෙ හොරිකඩයො කියල. දැන් ගුරුවරු අවුරුදු 24ක් නොවිසඳිච්චි ප්‍රශ්නෙ විසඳගන්න උගුර ලේ රහ වෙනකම් කෑ ගගහ පාරේ අව්වෙ පිච්චි පිච්චි යනව. සර් මෙතන හොරෙන් පංතියක් දාල. දැන් මොකද පඩි වැඩිවුණොත් මට නම් එපා කියලද සර් කියන්නෙ" සමන හොරිකඩයා වර නගනව.

"අන්න හොරි... කඩය එනව" කොරිඩෝවට වැටිච්ච බෝලෙ ගන්න පැනපු මංජුව කිවුව සද්දෙට ඔක්කොටම හිනා.

"ඇයි ළමයිනේ හිනා වෙන්නෙ? මං එන්නෙ නැති වෙයි කියල හිතුවද?" පොලිටික්ක ආවෙ අන්තිම අඩි ටික වේගෙන් තියාගෙන.

"නෑ සර්... අපි හිතුව සරුත් ස්ට්‍රයික්ද කියල?" අනුරුද්දිය අවස්ථානෝචිත ගල් පැලෙන බොරුවක් අතෑරිය.

"නෑ නෑ... මම ස්ට්‍රයික් කරන්නෙ නෑනෙ මේ වෙලාවෙ. මම ඔයාලට කියල තියෙනවනෙ" පොලිටික්ක කියන්නෙ 'මම ඉගැන්වීමටම උපන්නෙමි' වගෙ.

"ඇයි සර්ට පඩි වැඩියි වගේද?" කනිය කිවුවෙ ගෙවිච්ච හම් මල්ල දිහා බලාගෙන.

"ඇත්ත. පඩි හදල නෑ. ප්‍රශ්නයක් තියෙනව. ඒත් මේ වෙලාවෙ ආණ්ඩුවට රිද්දන එක හොඳ නෑ" පොලිටික්ක කන කහන ගමන් කිවුව.

"එහෙනම් හොඳ වෙලාව කියන්නකො සර්... කනිය කළේ අභියෝගයක්.

"භාණ්ඩාගාරෙ සල්ලි උතුරල යන වෙලාව බලලද එතකොට ඉල්ලන්න ඕනෙ. ඒක දන්නෙ බැසිල් සර් විතරනෙ" මංජුවත් යෝකර් එකක් දැම්ම.

"සර් කියන එක හරි මේක නෙමෙයි වෙලාව... දැන් අවුරුදු විසි හතරක්ම ගියානෙ සර් ප්‍රශ්නෙ. තව ටිකක් කල් ඉඳල ඔය ඉල්ලීම විශ්‍රාමිකයින්ගෙ සංගමයෙන්ම ඉල්ලුවනම් ඉවරයි, පඩිය නෙමෙයි පෙන්ෂන් එකවත් හදල දෙන්න කියල. මං හිතන්නෙ ආණ්ඩුව හිතන හරි වෙලාව ඒක තමයි. වැඩේ කියන්නෙ එතකොටත් කියයිද දන්නෙ නෑ හරි වෙලාව මේක නෙමෙයි තව ටිකක් කල් ඉන්න කියල... ප්‍රශ්නෙ ඉවරෙටම ඉවර වෙනකන්" සමන කියනකොට පොලිටික්ක මූණ හම් මල්ලට ඔබා ගත්ත.

## කවුළුව හැරමි තබමි

# මොළ හතා...



බැසිල් රාජපක්ෂගේ පාර්ලිමේන්තු ආගමනයත් සමග සමහර ඇමැත්තෝ පැවසුවේ ඔහුට මොළ හතක් තිබෙන බවය. උදේ ප්‍රවෘත්ති අවසන් වී මේ දිනවල බොහෝ ටී.වී. නාලිකාවල යන ලෝකය සහ ලෝකයෝ, මේක පුදුම ලෝකයක් වැනි වැඩසටහන්වල සමහරදාට ඔළු දෙකේ හරක්, කකුල් දෙකේ බූරුවෝ, දිව දෙකේ කොටළුවෝ වැනි ජාන විකෘති වූ සතුන් පෙන්වයි. බොහෝ විට අපි දකින්නේ උපදින විටම මිය ගිය ඔවුන්ගේ මළකුණුය. ඉදින් මොළ හතේ මිනිසෙක් නම් ඔහු අනිවාර්ය ලෙසම ජාන විකෘතියකි. එවැනි ජාන විකෘතියකින් රටකට වන වැඩක් නැත. අප දන්නා පරිදි ඉහත වර්ගයේ ප්‍රකාශ නිකුත් කරන ජාන විකෘති වූ විශාල පිරිසක් අද පාර්ලිමේන්තුවේද සිටිති. විපක්ෂයේද සෑහෙන පිරිසක් සිටිති. ඔවුහු කිසිවිටෙකත් රටේ ඡන්දදායකයාගේ පරීක්ෂාවට භාජනය නොවෙති. එසේ වන්නේ මෙවැනි ජාන විකෘති රෝගයකින් රටේ බහුතරයක්ම පෙළෙන නිසා දැයි අපි නොදනිමු.

අර මොළ හතේ මිනිසා මුදල් ඇමතිකම ගත් විගස කර ඇති හෙණ හතේ වැඩය වන්නේ කෙලවරපිටිය බලාගාරය ඇමෙරිකානු සමාගමකට හොර රහසේම විකුණා දැමීමය. දැන් ඔහු කළු සල්ලි සුදු කරන මුදල් පනතක් සම්මත කරගැනීමට යයි. මේ විශ්වකර්මයා ගැන ආණ්ඩුවේ මැති ඇමතිලා සහ සමහර මාධ්‍ය මැවූ ප්‍රබන්ධ රැසකි. ඔහු පැමිණියහොත් තෙල්මිල අඩුවීම, බඩු මිල අඩුවීම, ආර්ථිකය හිටි ගමන් කෙලින්වීම ඒ ප්‍රබන්ධවලින් සමහරකි. කොටින්ම රාජපක්ෂවරුම යනු තනිකරම ප්‍රබන්ධයකි. ඒ ප්‍රබන්ධකරණයට තවදුරටත් හසුවෙන මිනිසුන්ට පිහිට ලැබෙනු ඇත්තේ සාතන්ගෙනි. එසේ නොකියා වෙන කුමක් කියන්නදැයි අපට නම් නොතේරේ. මේ පාත්වූයේ මොළ හතක්ද හෙණ හතක්ද යන්න මේ වන විටත් තහවුරු වෙමින් තිබීම එයට සාක්ෂි දරනු ඇත.


# හැම පිස්සෙකුටම මොළයක්ද තිබේ...



මේ දිනවල රට පුරා දියත්වී තිබෙන ගුරු විදුහල්පති ඉල්ලීම් පෙරටු කොටගත් උද්ඝෝෂණ මාලාවේදී පසුගියදා අත්අඩංගුවට ගත් වෘත්තීය සමිති නායකයින් කිහිප දෙනෙකු සම්මත නීතියට පිටින් බලහත්කාරී නිරෝධායනයකට යොමු කිරීම මාධ්‍ය තුළ විශාල කථා බහකට ලක් කෙරුණි. එහිදී සෞඛ්‍ය ඇමතිනී පවිත්‍රා දේවිය අපූරු ප්‍රකාශයක් කළේය. එනම් මාක්ස්ද, ලෙනින්ද, ජෝෂප් ස්ටාලින්ද, පියුමීද කියා තමන්ගේ ආණ්ඩුවට වෙනසක් නැති බවය. ආණ්ඩුව කාටත් නීතිය එක සමානව ක්‍රියාත්මක කරන්නේය කියාය. එසේ ක්‍රියාත්මක වන බව මේ ආණ්ඩුව පුන පුනා පෙන්වා දෙමින් සිටින නිසා අපි ඒ ගැන කතා නොකරමු. පවිත්‍රා දේවිය, ජෝෂප් ස්ටාලින් ගැන සඳහන් කළේ ඉහත අත්අඩංගුවට ගැනීමේදී ගුරු සංගම් නායකයෙකු වූ ලංකාවේ ජෝසප් ස්ටාලින් කෙනෙකුද අත්අඩංගුවට පත්වූ නිසාය. ඊට අනුපූරක ලෙස ඇය මාක්ස්, ලෙනින්වද ඈඳා ගති. සමහර විට ඇය සිතා සිටින්නේ මේ තවමත් ඉන්නේ රුසියාවේ සිටි ස්ටාලින්ම දැයි අපි නොදනිමු. නමුත් ධම්මික පැණිය බිව් ඇය පාර්ලිමේන්තුවේ පිස්සු කෙළිමින් සිටින බව නම් අපි දකිමු. මාක්ස් ලෙනින් යනු කවුරුදැයි කියා අබමල් රේණුවක තරම දෙයක් දන්නා දරුවෙකුවත් ඔවුන්ව මෙසේ ස්ටාලින් සමග සමතාවයේ තබා කතා කරන්නේ නැත. දුමින්ද සිල්වලා සංස්ථා සභාපතිලා වෙන රටක පවිත්‍රා දේවියට උතුර දකුණ මාරුවීමද එක අතකට අරුමයක් නොවේ.

# මාටින් සහ සූටින්...

අපේ රටේ විපක්ෂ නායකයා නම් ටොප් - ලොජික් බඩුවකි. ඔහු වරක් කොරෝනාවලට බෙහෙත් කීමට ගොස් ඇණ ගත්තේය. ඊට කලින් ශ්‍රී මුඛය ගැන කතා කිරීමට ගොස් ඇණ ගත්තේය. මීට ටික දිනකට පෙර අරුන්දතී රෝයි ගැන කතා කිරීමට ගොස් ඇණ ගත්තේය. ඉන්පසු ඊයේ පෙරේදා විශ්වාස භංගයක් ගෙනත් නා ගත්තේය.



රටේ දසතින් නැග එන ආණ්ඩු විරෝධය ආණ්ඩුවේ තෙල් ඇමතියාට ලසුකර ආණ්ඩුව ඇතුළේ මතුවෙමින් ආ ප්‍රතිවිරෝධයන් තාවකාලිකව හෝ නතර කරදී දිරායන ආණ්ඩුව පිරියම් කිරීම හැර අන් යමක් එම ඊනියා විශ්වාසභංගය මගින් නම් සිදු නොවිණි. කම්කරු, ගොවි, ධීවර, සිසු-ගුරු ප්‍රශ්න වගේම සීඝ්‍රයෙන් උග්‍රවන ජීවන වියදම, බඩු මිල, ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කිරීම මර්දනය වැනි බරපතළ ගැටලු මගින් ආණ්ඩුවට එරෙහිව හතරවටින් විරෝධය නැග එද්දී ඒවා පසෙකලා සමගි ජන බලවේගයේ නායකයා ඇතුළු පරිවාර සේනාව කළේ නැවත වරක් රටම හිනස්සා අවසානයේ දිරායන රාජපක්ෂ පාලනයට නැවත තෙල් සාත්තුවක් ලබාදීමය.

දැන් එ.ජා.ප. නායකයා ඍජුවම මේ ආණ්ඩුව රකිමින් සිටින අතර විපක්ෂ නායකයාද වටේ දුවමින් එයම කරමින් සිටී. රටටම පිළිලයක් වී ඇති රාජපක්ෂ පාලනය වෙනුවට ඊට විකල්පයක් ලෙස මේ විකාරශීලී විපක්ෂ නායකයා මෙන් ඔහුගේ කණ්ඩායම බලයට ගෙන ඒමට කෙනෙකු සිතන්නේ නම් ඔහුගේ මොළය තෙවරක්වත් පරීක්ෂාවට ලක්කළ යුතුය. එය හරියට කොරෝනා තෙවෙනි රැල්ල අතරතුරම හතරවෙනි රැල්ලද කැඳවා ගැනීම වැනි වැඩකි. අපේ රටට මේ ඉරණම අත්වී ඇත්තේ මේ අලි - සාටක වසංගතය නිසා බව අවබෝධ කර ගැනීමට මොළ හතක්ම ඕනෑ නැත.

# රටට ඇති වී තිබෙන ඉරණම බනිජ තෙල් සංස්ථාවේ ඉරණමට සමානයි

පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම් නායක
අනුර දිසානායක සහෝදරයා

*(බනිජ තෙල් අමාත්‍යවරයාට එරෙහි විශ්වාසභංග යෝජනාව පිළිබඳව විවාදයට සහභාගි වෙමින්)*



අපි දන්නවා, තෙල් සංස්ථාව කියන්නේ රටේ ආර්ථිකයේ ඉතාම වැදගත් කේන්ද්‍රස්ථානය බව. රටේ ආර්ථිකය මෙහෙයවීමේදී එය ඉතාම වැදගත් කාර්ය භාරයක් ඉටුකරනු ලබනවා. තෙල් ගෙන්වීම, පිරිපහදු කිරීම, බෙදා හැරීම, විකිණීම සඳහා පමණක් නොවෙයි තෙල් සංස්ථාව ගොඩනැගී තිබෙන්නේ. ඒකත් එක්ක ගොඩනැගුණු විශාල කර්මාන්ත පද්ධතියක් තිබුණා. අපි දන්නවා, විශේෂයෙන්ම 1964දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය එය රජයට පවරා ගත්තාට පසුව 1968දී තෙල් පිරිපහදුවක් සෑදීම ආරම්භ කළ බව. 1969දී ඒ පිරිපහදුව පටන් ගන්නවා. එම පිරිපහදු යන්ත්‍රණයේ දෛනික ධාරිතාව බැරල් 38,000යි. ඒ, 1968දී; අදට අවුරුදු 53කට පෙර. හැබැයි, හිටපු ආණ්ඩු, හිටපු ඇමතිවරු එම ධාරිතාව කොපමණ ප්‍රමාණයකින් වැඩි කර තිබෙනවාද? එදා අවශ්‍යතාව සහ අද අවශ්‍යතාව සංසන්දනය කර බලනකොට එම අවශ්‍යතාව හත්අට ගුණයකින් වැඩි වී තිබෙනවා. හැබැයි, දෛනික පිරිපහදුව බැරල් 12,000කින් තමයි වැඩිවෙලා තිබෙන්නේ. අද තෙල් මිලට අන්න ඒ ගැටලුව බලපා තිබෙනවා.

ඊළඟට එම කර්මාන්තය හා සම්බන්ධ අතුරු නිෂ්පාදන ගත්තොත්, නයිලෝන් නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් තිබුණා. ඒක ආශ්‍රිතව ඉටිපන්දම් නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් තිබුණා. එම කර්මාන්තශාලාව 1992දී වහලා දැම්මා. මොකද, එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අනුගමනය කරපු නව ආර්ථික ප්‍රතිපත්ති අනුව, ඒ කියන්නේ රජය ක්‍රමානුකූලව ව්‍යාපාර සහ කර්මාන්තවලින් ඉවත් වීමේ ප්‍රතිපත්තිය අනුව වතු විකුණමින්, පේෂ කර්මාන්තශාලා විකුණමින් අවසානයේදී ආවේ මොකටද? නයිලෝන් කර්මාන්තශාලාව විකුණන්නයි ඒ සියලු කටයුතු සිදු කරමින් ආවේ. ඒ වෙලාවේ කර්මාන්ත ඇමතිවරයා වශයෙන් කටයුතු කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඒ වාගේම පොහොර නිෂ්පාදනය කළා. තෙල් පිරිපහදුවෙන් එන නැෆ්තා උපයෝගී කරගෙන, වායුවේ තිබෙන නයිට්‍රජන් උපයෝගී කරගෙන, යූරියා නිෂ්පාදනය කරන්න පුළුවන්. 1981දී පළ වුණු පුවත් පත් දැන්වීමක් මා ළඟ තිබුණා. ඒ කාලයේ පොහොර සංස්ථාව පාකිස්තානයට පොහොර මෙට්‍රික් ටොන් 50,000ක් පැටෙව්වා. රටේ අවශ්‍යතාවට වඩා අතිරික්ත වශයෙන් පොහොර නිෂ්පාදනය කරපු කර්මාන්තශාලාවක් තිබුණා. ඒක 1985දී වහලා දැම්මා. තෙල් සංස්ථාවත් ඒවායින් ලාභ උපයා ගත්තා.

රටේ අවශ්‍යතාව සියයට 100ක්ම සපුරන්න පුළුවන් ලිහිසි තෙල් නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක්ද තෙල් සංස්ථාව සතුව තිබුණා. 1994 දී චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව එම ලිහිසි තෙල් කර්මාන්තශාලාවෙන් සියයට 51ක් ඇමෙරිකානු කැල්ටෙක්ස් සමාගමට විකුණා දැම්මා. නොබෝ දිනකින් එහි ඉතිරි ටිකත් විකුණා දැම්මා. ඒවා තෙල් සංස්ථාවට ලාභයක් උපයා දුන් ස්ථාන. ඊළඟට, නැව් තෙල් අංශය තිබුණා. 2003 වසරේදී ලංකා මෙරායන් සර්විසස් කියලා සමාගමක් හදලා, එම සමාගම හරහා නැව් තෙල් අංශය ජෝන් කීල්ස් සමාගමට විකුණුවා. අපේ රට ආසන්නයෙන් වසරකට නැව් 36,000ක් ගමන් කරනවා. එම නැව් 36,000න් සියයට 10කට තෙල් සැපයීමේ පහසුකම ලබාදෙන්න අපට පුළුවන්නම් අපට තෙල් ගෙන්න යන වියදමෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයකට සමාන ඩොලර් උපයන්න පුළුවන්. එවැනි වටිනා සම්පතක් අපට තිබුණා. එම සම්පත 2003 දී ජෝන් කීල්ස් සමාගමට විකුණුවා. පසුව එයට විරුද්ධව වාසුදේව නානායක්කාර මැතිතුමා COPE එකේ වාර්තාව මත පදනම්ව නඩුවක් දැම්මා. 2008 වසරේදී ඒ නඩුවේ තීන්දුව දුන්නා. 2008 වසරේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළා, ඒක ජෝන් කීල්ස් සමාගමට විකිණීම වැරදියි, එය නැවත රජයට පවරා ගන්න කියලා. එතකොට මොකක්ද කළේ? එවකට මහින්ද රාජපක්ෂ මැතිතුමා ලංකා මැරයින් සර්විසස් සමාගම නැවත තෙල් සංස්ථාවට පවරනවා වෙනුවට ඒක වරායට පැවරුවා. මොකද, වරාය චමල් රාජපක්ෂ මැතිතුමා අතේ තිබුණේ. දැන් වාගේම තමයි ඒ කාලයේත්. දැන් ඊට වඩා වැඩියි. එසේ පැවරුවාට පසුව මොකද වුණේ? ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව තිබුණු නැව් තෙල් අංශය වරාය අධිකාරිය නැවත ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් සමාගමට විශේෂයෙන් IOC සමාගම ඇතුළු සමාගම් හතකට පවරා දී තිබෙනවා. ඊළඟට, භාණ්ඩාගාරයේ මුදල් වියදම් කොට රටට ගොඩ නැගූ කොළොන්නාව හා මුතුරාජවෙල තෙල් ගබඩා සංකීර්ණයෙන් තුනෙන් එකක් IOC සමාගමට විකුණුවා. IOC සමාගම මේ ආසන්න කාලයට පමණක් රුපියල් මිලියන 10,000කට වැඩි ලාභයක් ඒ තුනෙන් එක අරගෙන උපයා තිබෙනවා. ඊළඟට, petrol sheds විකුණුවා. ඒ විතරක් නොවෙයි, ත්‍රිකුණාමලයේ වැදගත්ම ගබඩා සංකීර්ණය වන China Bay Oil Tank Farm එක විකුණුවා. ඊට පසු මොකද වුණේ? තෙල් ගෙන්වීම, විකිණීම කියන තැනට පමණක් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව හිර වුණා. එමනිසා අද අපේ රටේ බනිජ තෙල් වෙළෙඳපොළේ ඇති වී තිබෙන ගැටලුව මතු වී තිබෙන්නේ බලශක්ති ඇමතිවරයාගේ පමණක්ම වූ කරුණක් මත නොවෙයි. රටේ ආර්ථික ප්‍රතිපත්තිය ඒ සඳහා බලපා තිබෙනවා. 1978න් පසු අපේ රටේ අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව කවුරු හෝ සමීක්ෂණයක් කරනවා නම්, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව ඇසුරින් එම සමීක්ෂණය සිදු කිරීමයි වැදගත්ම දේ. මොකද, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට ඇති වී තිබෙන ඉරණමට සමානයි. රටට ඇති වී තිබෙන ඉරණම.

අද මේ තෙල් මිල වැඩිවීම සඳහා ඉහත කී සියලු සාධක බලපා තිබෙනවා. එම නිසා මෙය මුළුමනින්ම වර්තමාන අමාත්‍යවරයාගේ පමණක් වගකීමක් ලෙස මා සලකන්නේ නැහැ. හැබැයි, එතුමාටත් අත් හරින්න බැරි වගකීමක් මේ තුළ ගැබ්වී තිබෙනවා. පළමු දේ තමයි ආණ්ඩුව හැටියට තිබෙන වගකීම. දශක ගණනාවකට පසුව පසුගිය අවුරුද්දේ මුල් භාගයේ ලෝක වෙළඳපොළේ අඩුම තෙල් මිල වාර්තා වෙන්න පටන් ගත්තා. ලෝක වෙළඳපොළේ තෙල් මිල අඩු වී තිබෙනවා. නම් එම වාසියම ජනතාවට ලබාදිය යුතුයි. හැබැයි, එම වාසිය ජනතාවට ලබානොදීම සඳහා කථාවක් හැදුවා. ඒ මොකක්ද? තෙල් මිල ස්ථායීකරණය කරනවා කීම. තමුන්නාන්සේලා වචනවල අලංකාරත්වය උපයෝගී කරගෙන මේ මිථ්‍යාව හැදුවා. ඊට පස්සේ මහ බැංකු වාර්තාවෙන් කියනවා, තෙල් මිලස්ථායීකරණ අරමුදලේ රුපියල් බිලියන 65ක් එකතු වෙලා තිබෙන බව. හැබැයි, එම ස්ථායීකරණ අරමුදල උපයෝගී කර ගත්තේ මොකටද? එම ස්ථායීකරණ අරමුදල ගොඩ නැගීමේදී ජනතාවට කියූ කරුණු වෙනුවට, උපයෝගී කරගෙන තිබෙන්නේ, ලංකා විදුලිබල මණ්ඩලයේ බිල් ගෙවීමත්, භාණ්ඩාගාර බිල්පත් සම්පූර්ණ කිරීමත් කියන කාරණා වෙනුවෙන්.

එම නිසා වර්තමාන බලශක්ති ඇමතිවරයා හැටියට උදය ගම්මන්පිල මැතිතුමාට අත් හරින්න බැරි වගකීමක් තිබෙනවා. ලෝක වෙළඳපොළේ තෙල් මිල අඩුවී තිබියදී, එම සහනය ජනතාවට ලබා නොදී, තෙල් මිල ස්ථායීකරණය පිළිබඳව සූත්‍රයක් හඳුන්වා දෙනවා කිවුවා; අරමුදලක් ගොඩ නඟනවා කිවුවා. අන්න එය ක්‍රියාත්මක නොවීමේ පංගුව පිළිබඳවයි එතුමාට වගකීම තිබෙන්නේ. ඒ වෙලාවේ බලශක්ති ඇමති ධුරයේ නොසිටියාට ඔබතුමාගේ වචනවලින්ම ඔබතුමා මාධ්‍ය හරහාත් කිවුවා, තෙල් මිල ස්ථායීකරණ අරමුදලක් හදනවා කියලා.

ආණ්ඩුව මාස හයෙන් හයට ඇමතිවරු මාරු කළාට, "පසුගිය ඒවාට මම වග කියන්නේ නැහැ; මේකට මම වගකියන්නේ නැහැ" යනුවෙන් කියන්න බැහැ. ඒ නිසා ඒ ස්ථායීකරණ අරමුදලේ ප්‍රතිලාභ චෝදනාවෙන් වර්තමාන ආණ්ඩුවේ බලශක්ති අමාත්‍යවරයා විධියට එතුමාට ගැලවෙන්න බැහැ. ඒ, එක චෝදනාවක්.

ඊළඟට, බලශක්ති ඇමතිවරයා පදිංචි නිවස ගැනත් මම කියන්න ඕනෑ. මා හිතන විධියට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට වෙන්න ඇති එහි අයිතිය තිබෙන්නේ. හැබැයි, එය සංවර්ධනය කිරීම පැවරෙන්නේ එක්කෝ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශයට. නමුත්, CPSTL ආයතනයෙන් රුපියල් මිලියන 15ක්, රුපියල් ලක්ෂ 150ක් වියදම් කරනවා, එම නිවස අලුත්වැඩියා කරන්න. මා හිතවත් ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා මේ සභාවේදී කියනවා, "රටේ විශාල අර්බුදයක් තිබෙනවා; ඒ නිසා මේ විශ්වාසභංගය තිබෙන්නේ අපේ රටේ ප්‍රශ්නවලින් ගොඩාක් යට" කියලා. හැබැයි, එය ප්‍රශ්න ගොඩාක් යට තිබෙන කොට ඇමතිවරයාගේ නිවස අලුත්වැඩියා කිරීම වෙනුවෙන් CPSTL ආයතනයෙන් ලක්ෂ 150ක් වැය කරනවා. වර්තමාන අධිකරණ අමාත්‍යවරයා වන අලි සබ්රි මැතිතුමාගේ මල්ලී තමයි මෙම CPSTL සමාගමේ සභාපතිවරයා හැටියට කටයුතු කරන්නේ. අපි අහන්නේ මේකයි. අමාත්‍යවරයෙකුගේ නිවාස අලුත්වැඩියා කරන්න CPSTL ආයතනයෙන් ලක්ෂ 150ක් වැය කරන්නේ කොහොමද? මම දන්නේ නැහැ. ඉංජිනේරුවා ඒ මුදල යොදවපු විධිය. හදිසි මිලදී ගැනීම් යටතේයි යොදවා තිබෙන්නේ. අන්න ඒ කාරණයෙන් අමාත්‍යවරයාට මිදෙන්න බැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය.

අවසන් වශයෙන්, මම කියන්නේ මෙයයි. අපේ රටේ තෙල් ගෙන්වීම, මිශ්‍ර කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම, තෙල් සංස්ථාවේ ඒකාධිකාරයක්. නමුත් 2003 වසරේ දෙසැම්බර් මාසයේ තාවකාලික විධිවිධාන පනතකින් IOC සමාගමට ඒ සඳහා අවුරුදු 20කට බලපත්‍ර ලබාදුන්නා. ඒ නිසා දැන් IOC සමාගමට තෙල් ගේන්න පුළුවන්. ඒ කවදා වෙනකම්ද? 2023 දෙසැම්බර් වෙනකම්. 2023 දෙසැම්බර්වලින් පස්සේ IOC සමාගමට අපේ රටට තෙල් ගේන්නත් බැහැ; ගබඩා කරන්නත් බැහැ; බෙදා හරින්නත් බැහැ. දැන් මොකක්ද කරන්න හදන්නේ? පසුගිය මැයි මාසයේ 05වැනිදා උදය ගම්මන්පිල අමාත්‍යවරයා කැබිනට් පත්‍රිකාවක් දානවා. ඒ මොකක් වෙනුවෙන්ද? තෙල් ගෙන්වීම, මිශ්‍ර කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම, පිරිපහදුව සඳහා තිබෙන රාජ්‍ය ඒකාධිකාරිත්වය බිඳින්න. දැන් එතුමා අඳින ඇඳුමේ නොවෙයි වැදගත්කම තිබෙන්නේ. අපේ රටේ තෙල් සම්පත, විශේෂයෙන් බනිජ තෙල් වෙළඳපොළ කවර හෝ සමාගමක් අතට අත්පත් කරදීමට පනත් සංශෝධනය කිරීම සඳහා මේ අමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කළා. අන්න ඒකට අදාළ විරෝධය අපි ළඟ තිබෙනවා. ඒ වාගේම, තෙල් මිල වැඩි කිරීමේදී එය තීරණය කළ කමිටුවට එතුමා ගොස් තිබෙනවා. එතුමා ඒ පිළිබඳව තමන්ගේ පැත්තෙන් නිසි පරිදි කරුණු ඉදිරිපත් කොට නැහැ.

> අපේ රටේ බනිජ තෙල් වෙළෙඳපොළේ ඇති වී තිබෙන ගැටලුව මතු වී තිබෙන්නේ බලශක්ති ඇමතිවරයාගේ පමණක්ම වූ කරුණක් මත නොවෙයි. රටේ ආර්ථික ප්‍රතිපත්තිය ඒ සඳහා බලපා තිබෙනවා. 1978න් පසු අපේ රටේ අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව කවුරු හෝ සමීක්ෂණයක් කරනවා නම්, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව ඇසුරින් එම සමීක්ෂණය සිදු කිරීමයි වැදගත්ම දේ. මොකද, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට ඇති වී තිබෙන ඉරණමට සමානයි. රටට ඇති වී තිබෙන ඉරණම.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com





නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් හඬනගමින්...



COMMUNIST VIEW ප්‍රකාශනය එළිදක්වා...




ළමා හිංසනයට එරෙහිව සටන් වැද...



අධ්‍යාපන මිලිටරිකරණයට එරෙහි ජනතා ව්‍යාපාරය හමුවී...




සහෝදරත්වයේ දිනය වෙනුවෙන්...



ගොවි දුකට හඬක් වී...

# බලශක්ති අයිතිය ඇමරිකාවට පැවරීමට දරන උත්සාහය නතර කළ යුතුයි

ජනතා විමුක්ති පෙරමුණේ නායක

**අනුර දිසානායක සහෝදරයා**



දේශප්‍රේමිත්වය ගැන කථා කළ වත්මන් ආණ්ඩුව විසින් මේ වන විට රට විශාල අනතුරක හෙළා තිබෙන බවත් රට ලෝක භූ දේශපාලන පොර පිටියේ ගැටුම්වලට මුහුණ දෙන මධ්‍යස්ථානයක් බවට පත් කරනු ලැබ ඇති බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, රටේ ජාතික සම්පත් චීනයටත් ඉන්දියාවටත් අලෙවි කරමින් සිටින ආණ්ඩුව අනෙක් පසින් රටේ අතිශය වැදගත් බලශක්ති ක්ෂේත්‍රය ඇමරිකාවට පැවරීමට තැත් කරන බවත් එම උත්සාහය වහා නතර කළ යුතුව ඇති බවත් අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 13වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. රටේ ආරක්ෂාවටත් ආර්ථිකයටත් අතිශය අහිතකර ලෙස බලපාන කෙරවලපිටිය විදුලි බලාගාරය පිළිබඳ කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ තිබීමත් ඒ අනුව මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආටිගල මහතාත් නිව් ෆෝට්‍රස් ඇමරිකානු සමාගම සමග ගිවිසුමක් අත්සන් කොට තිබීමත් පිළිබඳව අදහස් දැක්වීම සඳහා මේ මාධ්‍ය හමු පැවැත්විණි. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මේ ගිවිසුම අනුව 2025 වන විට විශාලතම බලාගාරය, වසර 05ක් යන තුරු ගෑස් සැපයුම, ගබඩා සංකීර්ණය හා නල පද්ධතිය ඇමරිකානු සමාගම සතු වනවා. රටේ මුළු බලශක්තිය මේ ඇමරිකානුවන් විසින් ඇමරිකාවට පාවා දී තිබෙනවා. මේ බව අපි පසුගිය ජනාධිපතිවරණයේදී මේ ඇමරිකානු පුරවැසියන් ජනාධිපති පුටුවල වාඩි වූයේත් දැන් කඩිමුඩියේ පැමිණ මුදල් අමාත්‍ය ධුර භාර ගන්නේත් රටේ ජාතික සම්පත් ඇමරිකානු සමාගම් වෙත පවරා දීමට තිබූ යටි සැලසුම් අනුවයි. රටක බලශක්ති ක්ෂේත්‍රය කවර හෝ වෙනත් රටකට හිමි වනවා යන්නේ තේරුම ඒ රටේ ආර්ථිකයත් ආරක්ෂාවත් බලශක්තිය අයත් රටට හිමි වන බවයි.

මේ එක ගිවිසුමක්වත් පාර්ලිමේන්තුවට ගෙනාවේ නැහැ. කැබිනට් මණ්ඩල මාධ්‍ය හමුවේදී මෙවැනි කැබිනට් පත්‍රිකාවක් අනුමත කරන ලද බව කිවුවේ නැහැ. මේ රටේ අයිතිකරුවන් රාජපක්ෂ පවුලද? ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ අගමැති මහින්ද රාජපක්ෂ, මුදල් ඇමති බැසිල් රාජපක්ෂ මේ රටේ ජාතික සම්පත් තමන්ගේ බූදලයක් වගේ විකුණා දැමීම සඳහා සැලසුම් කරනවා."



# තහනම් රසායනික පොහොර ආනයනය කළේ කාගේ අවසරයෙන්ද?

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික

**වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**

රසායනික පොහොර මුළුමනින්ම තහනම් කළ බවට ජනාධිපතිවරයා විටින් විට රටට ප්‍රකාශ කර ඇති බව තිබෙන නමුත් පසුගිය ජූලි 09වැනි දින යූරියා මෙට්‍රික් ටොන් 10,000ක් වරායට ගොඩ බා ඇති බවට තොරතුරු වාර්තා වී ඇතැයි ජනතා විමුක්ති පෙරමුණේ මාධ්‍යම කාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා අනාවරණය කළේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ පසුගිය 13වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවට එක් වෙමිනි. මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ නලින්ද ජයතිස්ස සහෝදරයා මෙසේද පැවසීය.

"එක වෙලාවක කෘෂිකර්ම අමාත්‍යාංශ නිලධාරීන් කැඳවලා ජනාධිපතිවරයා ඒ නියෝගය ලබාදුන්නා. ඒ වගේම රසායනික පොහොර ආනයන තහනම පසුගිය දිනක ජාතිය ඇමතීමේදී ප්‍රමුඛ ප්‍රකාශයක් බවට පත්වුණා. නව මුදල් ඇමතිවරයා ලෙස බැසිල් රාජපක්ෂ පත්වූ අවස්ථාවේදී රටේ යම් ප්‍රවෘත්තියක් නිර්මාණය වුණා යම් යම් වගාවන් හා යම් යම් බෝගයන් සඳහා රසායනික පොහොර ගෙන්වන්න අවසර දෙනවා කියලා. නමුත් ජනාධිපති ලේකම් කාර්යාලය ක්ෂණිකව මැදිහත් වෙලා ජනාධිපතිවරයා කලින් ගත් තීරණයේ කිසිදු වෙනසක් නැති බව තහවුරු කළා.

නමුත් අපිට දැන් තොරතුරු ලැබිලා තිබෙනවා මෙම ජූලි මස 09වෙනිදා වරායට ගෙනවිත් තිබෙනවා යූරියා මෙට්‍රික් ටොන් 10,000ක්. රසායනික පොහොර ගෙන්වූ බවට රේගු ප්‍රකාශන තිබෙනවා. ඒ නිසා ජනාධිපතිවරයා මේ පිළිබඳව රටට ප්‍රකාශයක් කළ යුතුයි. එසේ නැත්නම් ජනාධිපති ලේකම් කාර්යාලය මීට දින කිහිපයකට කලින් කළ ප්‍රකාශය බොරු බවට පත්වෙනවා."



# කළු සල්ලි සුදු කරන පනතින් සිදුවන්නේ නීතියෙන් දඬුවම් ලැබිය යුතු අය ආරක්ෂා වීමයි

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික

**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

නීතිවලින් මේ වනවිට හෙළිදරව් නොකළ වත්කම් සහ ආදායම් පිළිබඳව ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී හෙළිදරව් කරන තැනැත්තන්ට දණ්ඩනයක් නියම නොකර සහන ලබාදීම සඳහා ආණ්ඩුව නව මුදල් පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇතැයි පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා , ආණ්ඩුව මේ පනත ඉදිරිපත් කර ඇත්තේ, රටේ පවතින නීතිය අනුව හෙළිදරව් නොකළ, ජනතාවගේ බදු මුදල් වංචා කළ බදු හොර නඩයකට පහසුකම් සලසා දීම බව පැවසීය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මේ පිළිබඳව කරුණු දැක්වූයේ පසුගිය 21වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද ප්‍රකාශ කළේය.

"ආදායම් මත, තමන් අත්පත් කරගත්ත දේපළ මත නීතිය හමුවට ගෙනගොස් දඬුවම් ලබන්න ඕනෑ අය ආණ්ඩුවට 1%ක පගාවක් දීලා බේරෙන්න නීතියක් මේ ගෙනත් තියෙන්නේ. මේකේ බරපතළ තත්වය වෙන්නේ රජයට නොගෙවා පැහැර හැර තිබෙන සියලුම් වත්කම් සහ ආදායම් බදු අඩු තරමින් තොරතුරු දැන ගැනීමේ පනත යටතේවත් නිරාවණය කරගන්න බැහැ. මේකෙන් දිරි ගන්වන්නේ හොරකම. මේ හරහා අයථා මාර්ගවලින් මුදල් ඉපයීම දිරි ගන්වන්නේ. මේකෙන් කරන්නේ ආර්ථිකය ශක්තිමත් කිරීම නෙවෙයි. රාජපක්ෂ සමාගමේ ආර්ථික උපායමාර්ගය වෙලා තියෙන්නේ අයථා මුදල් ඉපයීම් දිරි ගන්වන එක. එක කැබිනට් මණ්ඩලයේ එකම පවුලේ ඉන්න වැඩිම පිරිසක් හැටියට ලෝකයෙන්ම මුල් තැනට ඇවිත් තිබෙනවා. මේ තත්වය තුළ ගෙනත් තිබෙන මුදල් කෙටුම්පත ඉතාම බරපතළ බව කාටත් පැහැදිලියි."

# වෛරය වෙනුවට ආදරය සහ සහෝදරත්වය ගෙනා හැක්කේ සමාජවාදයටයි

සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක

**එරංග ගුණසේකර සහෝදරයා**



පක්ෂයක් ලෙස මෙන්ම සමාජවාදී තරුණ සංගමය ලෙසත් ඉතාම අසීරු තත්වයන්හිදී පවා ජාතිවාදයට, ආගම්වාදයට එරෙහිව ක්‍රියාකර තිබෙන බව පෙන්වා දුන් සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, පවතින ධනවාදය කිසිදා ජාතික සමගිය ගොඩනැගීමක් සිදු නොකරන බවත් ඔවුන්ට අවශ්‍ය බෙදා වෙන්කිරීම් සහ එකිනෙකා අතර සිදුවන ගැටුම් බවත් සමාජවාදය මේ රටට ගෙන එන තුරු මෙවැනි සිදුවීම් ගැන කථා කිරීමට සිදුවනු ඇති බවත් ප්‍රකාශ කළේය.

එරංග සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 23වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. එය කැඳවනු ලැබ තිබුණේ කළු ජූලියට වසර 38ක් පිරීම වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කරන 'සහෝදරත්වයේ දිනය' ආශ්‍රිත වැඩසටහන් මාලාව පිළිබඳව දැනුවත් කිරීම වෙනුවෙනි.


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.